# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ආයතනයේ නම:**

**කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා**

**ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

**(2019.01.01 - 2019.12.09 දින දක්වා)**

**ප්‍රජා සවිබල ගැන්වීම් හා වතු යටිතල**

**පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය**

**(2019.12.10 - 2019.12.31 දින දක්වා)**

**වැය ශීර්ෂ අංකය 140**

# අන්තර්ගතය

පිටුව


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 - | ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 5-29 |
| පරිච්ඡේදය 02 - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 30-32 |
| පරිච්ඡේදය 03 - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 33-55 |
| පරිච්ඡේදය 04 - | කාර්යසාධන දර්ශක | 56 |
| පරිච්ඡේදය 05 - | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 57-59 |
| පරිච්ඡේදය 06 - | මානව සම්පත් පැතිකඩ | 60-63 |
| පරිච්ඡේදය 07 - | අනුකූලතා වාර්තාව | 64-72 |

# 1. පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම.

ශතවර්ෂ දෙකකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ මූලාරම්භය, මෙරට බ්‍රිතාන්‍යයේ යටත් විජිත යුගයක්ව පැවති සමය දක්වා පැතිර යයි. බ්‍රිතාන්‍යයන් විසින් වර්ෂ 1840 දී කඳුකරයේ කෝපි වගා කිරීම සඳහා කම්කරුවන් ලෙස දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ මෙම ජන කොට්ඨාසය, කෝපි වගාව විනාශවීමෙන් අනතුරුව ඇතිකළ තේ හා රබර් වගාවන් කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂී හුදකලා ජන කොටසක් ලෙස වර්ධනය වී ඇත.

ලැයින් කාමර හෙවත් පේලි නිවාස සිය වාසස්ථාන කොට ගනිමින්, ඉතා දිලිඳු කම්කරු ජීවන රටාවකට හිමිකම් කියන මොවුන්, මානව සංවර්ධන දර්ශක (නාගරික හා ග්‍රාමීය) හා සැසඳීමේදී, අන් ජන කොටස් වලට සාපේක්ෂව කැපී පෙනෙන සමාජ විෂමතාවකට ලක්ව ඇති බව පෙනී යයි. සමාජ සංවර්ධන දර්ශක හා සසඳා බැලීමේදී, ඔවුන්ගේ දර්ශකයන් ජාතික මට්ටමේ සමාජ සංවර්ධන දර්ශකයනට  වඩා පහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 5% ක් පමණ, වතු ප්‍රජාව නියෝජනය කරනු ලබයි. වැවිලි අංශය ආශ්‍රිතව මිලියනයක් පමණවන ජනගහනයක් ඍජුව හා වක්‍රව එම ක්ෂේත්‍රයේ නියැලී සිටින්නේ තමන් සතුව එක් බිම් අඟලක හෝ නීත්‍යානුකූල අයිතියක් නොමැතිවය. මොවුන් විශේෂයෙන්ම මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණු පළාත් නියෝජනය කරනු ලබන කළුතර, මහනුවර, මාතලේ,  නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුර හා කෑගල්ල වැනි දිස්ත්‍රික්ක ආශ්‍රිත වතු ප්‍රදේශයන්හි ව්‍යාප්තව සිටී. මෙම දිස්ත්‍රික්කයන්හි මුළු ජනගහනය මිලියන 9 ක් පමණ වන අතර ඉන් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් වැවිලි ප්‍රජාව වේ. එය එම දිස්ත්‍රික්කයන්හි මුළු ජනගහනයෙන් 11 % ක් පමණ වන ඉහළ අගයකි.

**වතු ක්ෂේත්‍රය පිළිබඳ මූලික දත්ත (කුඩා තේ වතු හැර)**
**ඉඩම් පිළිබඳ විස්තර**

- වතු සමාගම් සංඛ්‍යාව - 23
- වතු සංඛ්‍යාව- 453
- මුළු ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර් 280,034
  - තේ හෙක්ටයාර් 80,637
  - රබර් හෙක්ටයාර් 45,881
  - පොල් හෙක්ටයාර් 9,482
  - වගා නොකරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 117,275

    (මූලාශ්‍රය:- Annual Health Return, වැවිලි මානව සංවර්ධන භාරය (වැ.මා.සං.භා., 2014)

| ජනගහනය පිළිබඳ දත්ත - දිස්ත්‍රික්ක මට්ටමින් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විස්තරය | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | වර්ෂය | මූලාශ්‍රය |
| වතු ප්‍රදේශ ආශ්‍රිත දිස්ත්‍රික්ක වල මුළු ජනගහනය 2019 | 1,284,000 | 1,476,000 | 522,000 | 768,000 | 1,130,000 | 863,000 | 880,000 | 496,000 | 1,171,000 | 887,000 | 2019 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වතු ජනගහනය * 2019 | 39,547 | 91,807 | 20,567 | 410,726 | 20,001 | 23,905 | 166,056 | 9,176 | 107,264 | 60,316 | 2019 | දත්ත යාවකාලිකයි |
| වතු ජනගහනයේ * නියෝජනය ( %) | 3.08 | 6.22 | 3.94 | 53.48 | 1.77 | 2.77 | 18.87 | 1.85 | 9.16 | 6.80 | 2019 | |
| | | | | | | | | | | | | |
| මුළු වතු ජනගහනය * සිංහල - 2019 | 7,909 | 12,227 | 1,788 | 22,879 | 9,237 | 8,020 | 12,986 | 964 | 15,381 | 9,688 | 2019 | |
| මුළු වතු ජනගහනය * දෙමළ -2019 | 31,506 | 78,605 | 18,463 | 385,417 | 10,721 | 15,738 | 150,890 | 8,125 | 90,648 | 50,334 | 2019 | |
| මුළු වතු ජනගහනය * මුස්ලිම් -2019 | 106 | 830 | 274 | 2,063 | 12 | 142 | 1,894 | 67 | 1,021 | 220 | 2019 | |

මූලාශ්‍රයඃ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
* දත්ත යාවකාලිකයි

## වතු ක්ෂේත්‍රයට අදාල අනිකුත් දත්ත කිහිපයක්

| දර්ශක | වතු | ග්‍රාමීය | නාගරික | ජාතික | වර්ෂය | මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|
| දරිද්‍රතා අනුපාතය | 8.8 | 4.3 | 1.9 | 4.1 | 2016 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - HIES |
| මාසික ගෘහ ඒකක ආදායම | 34,804 | 58,137 | 88,692 | 62,237 | 2016 | |
| ප්‍රාථමික අධ්‍යාපන අනුපාතය | 5.0 | 74.0 | 21.0 | 100.0 | 2018 | සංඛ්‍යාන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය |
| ද්විතීයික අධ්‍යාපන අනුපාතය 6 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය දක්වා | 5.0 | 68.9 | 26.2 | 100.0 | 2018 | |
| ද්විතීයික අධ්‍යාපන අනුපාතය 11 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා | 3.5 | 63.0 | 33.6 | 100.0 | 2018 | |
| අවුරුදු 05 ට අඩු ළමුන් | | | | 1,871,000 | 2019 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |
| අවුː 05 ට අඩු ළමුන්ගේ මිටිබව | 31.7 | 17.0 | 14.7 | 17.3 | 2016 | ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව- ප්‍රජා විද්‍යා හා සෞඛ්‍යය සමීක්ෂණය |
| අවුː 05 ට අඩු ළමුන්ගේ අඩුබර | 29.7 | 20.8 | 16.4 | 20.5 | 2016 | |
| අවුː 05 ට අඩු ළමුන්ගේ කෘෂබව | 13.4 | 15.6 | 12.9 | 15.1 | 2016 | |

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ 25 වෙනි වගන්තිය, සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 17, 23 හා 24 වගන්ති මෙන්ම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 11 (1) වගන්තියට අනුව ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය සේවා හා ආරක්ෂාවද, අවශ්‍ය සමාජසේවා ආරක්ෂාවද ඇතිව, තමන්ගේත් තම පවුලේත් සෞඛ්‍යයට හා යහපතට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමටත්, තම පාලනයෙන් බැහැර ආපදා හේතුවෙන්, ජීවිකාව දුෂ්කර වූ විට රැකවරණය ලැබීමටත්, පූර්ණ මනුෂ්‍යයෙකු බිහිවීම සඳහා අවශ්‍ය පෞද්ගලිකත්වය හා පෞද්ගලික අවකාශය භුක්ති විඳීමටත්, සෑම මනුෂ්‍යයෙකුටම හිමිකමක් හා අයිතියක් ඇත.

ශ්‍රී ලංකාවද සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10,11,13 හා 14 වගන්ති මගින්, මෙම අයිතිවාසිකම් තහවුරු කරමින් සියළු ජන කොටස් වෙත මෙකී සියළුම මූලික සේවාවන් සහ පහසුකම් භුක්ති විඳීමේ අයිතිය තහවුරු කරලීමේ භාරදූර වගකීම දශක ගණනාවක් තිස්සේ ක්‍රියාවට නංවමින් සිටී.

දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණිකයන් ලෙස පැමිණ මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණු පළාත් හි ප්‍රදේශවලට සීමාවෙමින්, හුදකලාව ඔවුන්ටම ආවේනික සමාජ, ආර්ථික සහ සංස්කෘතික කොටසක් ලෙස විකාශය වූ වැවිලි ප්‍රජාව, බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පටන්ම සිය මූලික අවශ්‍යතාවයන් උදෙසා වතු කළමණාකාරීත්වය මත යැපීම හේතුවෙන් රජය මගින් ඔවුන් වෙත සපයනු ලබන මූලික සේවාවන් භුක්ති විඳීමේ අවස්ථාව හිමිවූයේ ඉතා අල්ප මට්ටමකිනි.

එහි ප්‍රතිඵලය වී ඇත්තේ ශත වර්ෂ දෙකකට ආසන්න කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සුවිශාල දායකත්වයක් සපයනු ලැබූ මෙම ශ්‍රමික ප්‍රජාවට මෙම වරප්‍රසාද ලඟාවීම ප්‍රමාද වීමයි. එබැවින්, රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයන්හි පවතින නීති පද්ධතීන්හි ඇති ඇතැම් නොගැලපීම් හේතුවෙන්, පෞද්ගලික වතු සමාගම් යටතේ ජීවිකාවේ නියැලී සිටින මිලියනයකට ආසන්න ජන කොටස් වෙත නිසි සේවාවන් සැපයීමේ ඇති දුෂ්කරතා මගහැර, මෙම ප්‍රජාවගේ සමාජ සංවර්ධනය ප්‍රශස්ථ මට්ටමකට නැංවීම සඳහා සුවිශේෂිත වූ යාන්ත්‍රණයක් ඇති කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතුවිය.

ඒ අනුව, වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවන් අවම කොට ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින් හෙබි පුරවැසියන් ලෙස පරිණාමනය කිරීමේ අදිටනින්, ඔවුන්ගේ වාසස්ථාන, යටිතල පහසුකම්, ජීවනෝපාය හා සමාජ සංවර්ධන යන අංශයන් මුදුන් පැමිණවීම සඳහා විශේෂිත අමාත්‍යාංශයන් ස්ථාපනය වූ අතර පසුගිය දශක දෙක තුලදී පහත පරිදි නාම ගැන්වූ අමාත්‍යාංශ හරහා වැවිලි ක්ෂේත්‍රයේ වෙසෙන ජනතාවගේ උන්නතිය උදෙසා සුවිශේෂී කාර්යභාරයන් ඉටු කරන ලදී.

- වතු යටිතල පහසුකම් ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
- තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
- ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශය
- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
- වැවිලි යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
- කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

2019.11.17 දින පිහිටුවන ලද නව රජය යටතේ 2019.12.10 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මගින් වැවිලි ප්‍රජාවද ඇතුලුව ග්‍රාමීය හා අර්බුද හේතුවෙන් අවතැන් වූ සමස්ත ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා ප්‍රජා සවිබල ගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ලෙස නාම ගතවූ නව කැබිනට් අමාත්‍යාංශයක් පිහිටුවන ලදී. මෙම නව අමාත්‍යාංශය යටතට එතෙක් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබූ,

- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය
- වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය ණය අරමුදල
- වැවිලි මානව සංවර්ධන භාරය
- සෞම්‍යමූර්තී තොණ්ඩමාන් අනුස්මරණ පදනම, යන ආයතනද එක් කරන ලදී.

ඒ අනුව ප්‍රජා සවිබල ගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම කාර්යසාධන වාර්තාවේ ඇතුලත් කරනු ලබන්නේ වැය ශීර්ෂ අංක 140 යටතේ පෙර පැවති කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්යසාධනය වේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### 1.2.1. 2019.12.09 දිනතෙක් පැවැති "කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සංවර්ධන හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ" දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යභාරයන්

### දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රජාව, අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම

### මෙහෙවර

වැවිලි අංශයේ ජනතාවගේ සුභසාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් ප්‍රවර්ධනය කිරීම

### අරමුණු


වතුකරයේ ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම තුලින් ඔවුන් සවිබල ගැන්වීම උදෙසා

1. නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
2. ජීවනෝපාය මාර්ග හඳුන්වා දෙමින් ආදායම් මට්ටම ඉහළ නැංවීම
3. සාමාජීයව හා සංස්කෘතිකව ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම
4. පෙරපාසල් වියේ සිට වෘත්තීය අධ්‍යාපනය දක්වා අධ්‍යාපනයට පහසුකම් සැපයීම
5. හදිසි ආපදා තත්ත්වයන්හිදී සහන හා උපදේශන සේවා සැපයීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

1. රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි පේළි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා නව ගම්මාන / නගර නිර්මාණය කිරීම.
2. ග්‍රාමීය වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
3. වතු අංශයේ ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
4. වැවිලි ප්‍රජාව ආර්ථිකව, සාමාජීයව හා සංස්කෘතිකමය වශයෙන් නගාසිටුවීම සඳහා මූලික පහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවරගැනීම.
5. පෙර පාසල් මට්මේ සිට වෘත්තීය පුහුණු මට්ටම දක්වා වන අධ්‍යාපන අවශ්‍යතා වෙනුවෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී මූලික පහසුකම් හා අනෙකුත් පහසුකම් සැපයීම.
6. හදිසි ආපදා තත්ත්වයන්හිදී අවශ්‍ය සහන සේවා සැපයීම, ඔවුන් නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා උපදේශන සේවා සැපයීම.

# කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
## (ප්‍රජා සවිබල ගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය) - වැය ශීර්ෂ අංකය 140
## සංවිධාන ව්‍යුහය (2019.12.31 දිනට)



### 1.4.1. 2019.12.31 දිනට අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පංතිය | අනුමත කාර්ය මණ්ඩලය | | තත්‍ය කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් | |
| 1. | ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | විශේෂ ශ්‍රේණිය | 1 | - | 1 | - | - |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | විශේෂ ශ්‍රේණිය | 2 | - | 2 | - | - |
| 3. | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ක්‍රි.සේවය | විශේෂ ශ්‍රේණිය | 1 | | 1 | | |
| 4. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - | - |
| 5. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - | - |
| 6. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍රි.සේවය | I පන්තිය | 1 | - | 0 | - | 1 |
| 7. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | I පන්තිය | 1 | - | 0 | - | 1 |
| 8. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - | - |
| 9. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - | - |
| 10. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | II/III පන්තිය | 1 | - | 0 | - | 1 |
| 11. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | II/III පන්තිය | 3 | - | 1 | - | 2 |
| 12. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍රි.සේවය | II/III පන්තිය | 2 | - | 2 | - | - |
| 13. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | II/III පන්තිය | 2 | - | 1 | - | 1 |
| 14. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | II/III පන්තිය | 2 | - | 1 | - | 1 |
| 15. | නීති නිලධාරී | | II/III පන්තිය | 1 | - | 0 | - | 1 |
| 16. | පරිපාලන නිලධාරී | රා.කළ.සහ.සේවය | අධි ශ්‍රේණිය | 1 | - | 0 | - | 1 |
| 17. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තො.හා.සං. | II/I | 1 | - | 1 | - | - |
| 18. | භාෂා පරිවර්තක | භාෂා පරි. සේවය | I/II පන්තිය | 2 | - | 0 | - | 2 |
| 19. | සංඛ්‍යා ලේඛන නිලධාරී | | | 1 | - | 1 | - | - |
| 20. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | - | 1 | - | 1 | - |
| 21. | සංවර්ධන නිලධාරී | ශ්‍රී.ලං.සං.නිල.සේ | I/II/III පන්තිය | 19 | - | 11 | 5 | 3 |
| 22. | තාක්ෂණික නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ | I/II/III පන්තිය | 8 | - | 0 | 3 | 5 |
| 23. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා.සං. සේවය | 3 - III/II/I | 2 | - | - | - | 2 |
| 24. | කළමනාකරණ සේවා නිලධාරී | කළමනාකරණ සේවා නිලධාරී සේවය | I/II/III පන්තිය | 25 | - | 16 | - | 9 |
| 25. | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | අමාත්‍යාංශගත | | 225 | - | 219 | - | 6 |
| 26. | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | | 1 | - | - | 1 | - |
| 27. | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | | 1 | - | - | 1 | - |
| 28. | කැමරා පුද්ගලික සහායක | තාවකාලික | | 1 | - | - | 1 | - |
| 29. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | I/II/III විශේෂ | 17 | - | 14 | - | 3 |
| 30. | කාර්යාල කාර්ය සහායක | කා.සේවක සේවය | I/II/III විශේෂ | 16 | - | 16 | - | - |
| **එකතුව** | | | | **341** | **1** | **291** | **12** | **39** |

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.5.1 ලේකම් අංශය

අමාත්‍යාංශයේ ප්‍රධානියා මෙන්ම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ද වශයෙන් කටයුතු කරන අමාත්‍යාංශ ලේකම් යටතේ ලේකම් අංශය ක්‍රියාත්මක වන අතර, එම අංශය වෙත පැවරී ඇති විශේෂ කටයුතු ක්‍රියාත්මක කිරීමත්, ගරු අමාත්‍යතුමා හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය කිරීමත්, අමාත්‍යාංශයේ අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය මෙන්ම රැස්වීම් සංවිධානය ආදිය සිදු කිරීමත් ලේකම් අංශය විසින් මූලික වශයෙන් සිදුකරනු ලබයි.

එමෙන්ම අමාත්‍යාංශ විෂය පථයට අදාලව දේශීය හා විදේශීය ආයතන මෙන්ම තානාපති කාර්යාල හා සම්බන්ධීකරණය, අවශ්‍යතාවන් අනුව දේශීය හා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ රැස්වීම් සංවිධානය, ආදියද ලේකම් අංශයෙන් සිදු කරනු ලබයි.

### 1.5.2 පාලන අංශය

වැවිලි ප්‍රජාව සඳහා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන ව්‍යාපෘති ඉලක්ක ගත වකවානු වලට අවසන් කිරීම සඳහා අවශ්‍ය අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය සැකසීම, නව තනතුරු ඇති කිරීම, නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම ඇතුළු අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය හා මෙහෙයවීම පාලන අංශයේ මූලික කාර්යභාරය වේ. එයට අමතරව,

- අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනය
- නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාල අනෙකුත් ආයතනික කටයුතු සිදු කිරීම
- පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම
- කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම හා අදාළ ආයතන වෙත බෙදා හැරීම
- ආයතනයේ මානව සම්පත් සැළැස්ම සැකසීම
- තොරතුරු දැනගැනීමේ පනතට අනුව කටයුතු කිරීම
- නිලධාරීන්ගේ නිවාඩු ආශ්‍රිත ලේඛන, ලිපිගොනු නඩත්තු කිරීම
- නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු සම්බන්ධව කටයුතු සිදු කිරීම
- වාහන සංචිතය පවත්වාගෙන යාම හා වාහන නඩත්තුව
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතර සම්බන්ධීකරණය, අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා වෙනත් අණපනත් අනුව කාර්ය මණ්ඩලය මෙහෙය වීම යනාදී ක්‍රියාදාමයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

### 1.5.3 සංවර්ධන අංශය

වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා අමාත්‍යාංශය, සංරචක 05 ක් යටතේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරය ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම හා සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල්ද යොදවමින් අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය මෙන්ම සැළසුම් අංශයද සංවර්ධන අංශයට සහය දක්වනු ලබයි.

1. පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය යටතේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   - I. පේළි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම.
   - II. සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම.
   - III. සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති.
   - IV. ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම.
   - V. වතු සහ වතු රෝහල් සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය (මාර්ග, අඩි පාරවල්, පියගැටපේළි සහ පාලම් ආදිය).
   - VI. පොදු පහසුකම් සංවර්ධනය

- ප්‍රජා / සංස්කෘතික මධ්‍යස්ථාන
- ක්‍රීඩාපිටි
- රැඳවුම් බිත්ති
- පෙර පාසැල් වැඩිදියුණු කිරීම
- විදුලි පහසුකම් සැපයීම
- මඩු හා පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර වැනි උපකරණ සැපයීම
- වැටවල් ඉදිකිරීම, පාසැල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම වැනි වෙනත් පහසුකම්

2. වතු හා ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   I. පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
      - මත්ද්‍රව්‍ය නිවාරණය
      - වකුගඩු රෝග පාලනය
      - පරිසර සංරක්ෂණය
      - ආහාර නිෂ්පාදනය
      - ග්‍රාමීය සමාජ සවිමත් කිරීම. උදා: සතුටු පවුල, සතුටු අධ්‍යාපනය, සතුටු රැකියාව
      - පෝෂණීය ආහාර සහ ආහාර පුරුදු
      - පුද්ගලික නිපුණතා සංවර්ධනය

   II. දරිද්‍රතාව අඩුකිරීම / කාර්ය මණ්ඩල සවිබලගැන්වීම
      - ගෙවතු වගාව
      - නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කාන්තා සමාජ ඇතිකිරීම/සවිමත් කිරීම
      - කාන්තාවන් සඳහා මුදල් කළමනාකරණ වැඩසටහන්

3. වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   I. නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   II. ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
   III. නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   IV. නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ඔප්පු ලබාදීම.
   V. නව ජීවන නිවාස වැඩසටහන් වලට අදාල ණය වාරික අයකර ගැනීම.

4. ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම.
5. ඉංජිනේරු ඇස්තමේන්තු, ව්‍යාපෘති මාර්ගෝපදේශ පිළියෙළ කිරීම.
6. සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
7. ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
8. තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E- kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ථ අධීක්ෂණය.
9. ඉන්දියානු ආධාර යටතේ හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම.

### 1.5.4 සැළසුම් අංශය

අමාත්‍යාංශයේ සමස්ථ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රධාන වශයෙන් පහත කර්තව්‍යයන් සැළසුම් අංශය මගින් ඉටු කරයි.

- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා අමාත්‍යාංශයීය වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම
- අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම

- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති යෝජනා සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම
- යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, සක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම
- අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- මෙතෙක් විශාල අඩුපාඩුවක්ව පැවැති වැව්ලි ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීම (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සංනිවේදන ආයතනය (ICTA) Price watercoop ආයතනය හා එක්ව) දත්ත සැකසුම් පද්ධතියක් සැකසීම, ප්‍රාදේශීය මට්ටමින් ඒ සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, දත්ත එක්රැස් කිරීම හා යාවත්කාලීන කිරීම.

### 1.5.5 ගිණුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාල ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම, රාජ්‍ය ආදයම එකතු කිරීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.

### 1.5.6 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීමත්, වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාල කරුණු අනාවරණය කිරීමත්, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

### 1.6.1 වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

විශේෂයෙන්ම, වැවිලි ප්‍රජාව සඳහා පිහිටුවා ඇති අමාත්‍යාංශයේ මූලික අරමුණක් වූ " නව ගම්මාන සංකල්පය " ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන අභිලාෂය පෙරදැරිව, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීමේ අරමුණින් අමාත්‍යාංශයට අනුබද්ධිතව අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවය මතුවිය.

ඒ අනුව 2018.06.25 වන දින, "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය" පිහිටුවීමට අදාල 2018 අංක 32 දරණ පනත, පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී.

#### 1.6.1.1 අධිකාරියේ දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ වෙසෙන ප්‍රජාව අන් ජන කොටස් හා සමාන තත්ත්වයකින් හෙබි ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම.

#### 1.6.1.2 අධිකාරියේ මෙහෙවර

වැවිලි ප්‍රජාව වෙත අන් ජන කොටස් හා සමානව, සංවර්ධනය හා සමෘද්ධිය ලැබීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ පොදු පහසුකම් සහිත නව ගම්මාන වතු ක්ෂේත්‍රය තුළ ස්ථාපිතව තිබීම.

#### 1.6.1.3 අධිකාරියේ අරමුණු

1. වැවිලි කලාපයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා යටිතල පහසුකම් සංවර්ධනය තුලින් හඳුනාගත් ප්‍රදේශවල වැවිලි ප්‍රජාව ප්‍රධාන සමාජ ධාරාවට ඇතුළත් කිරීම සහතික කිරීම.
2. හඳුනාගත් ප්‍රදේශවල වැවිලිප්‍රජාව, ඔවුනට ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි වන පරිදි සමාජමය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම.

**1.6.1.4 අධිකාරියේ ක්‍රියාකාරකම්**

1. වැවිලි ප්‍රදේශවල නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රජයේ සැළසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම සඳහා වැවිලි කලාපයේ අනෙකුත් ජාතික, දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.
3. නව ගම්මාන සංවර්ධනය සඳහා වූ රජයේ සැළසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී වැවිලි කලාපයේ ප්‍රජාමූල සංවිධානවල සහභාගිත්වය සහතික කිරීම.
4. වැවිලි ප්‍රදේශයන්හි ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා හිමිකම් ඔප්පු නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
5. වැවිලි ප්‍රදේශයන්හි වෙසෙන තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතීයික හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම.
6. වැවිලි ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවා සැපයීම පහසු කරලීම සඳහා පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවල ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල සමග කටයුතු කිරීම.
7. වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම හා යෙදවුම් සැපයීම.
8. තම ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ද ඇතුළු වතු අංශයේ විවිධ ප්‍රජා කණ්ඩායම් සවි බල ගැන්වීම.
9. වැවිලි ප්‍රදේශයන්හි පිහිටි නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ගෙන් පැවතෙන්නන්ට ද එම නීත්‍යානුකූල පදිංචිකරුවන් විසින් භුක්ති විඳිනු ලබන සියලු පහසුකම් සලසනු ලබන බවට තහවුරු කිරීම.
10. වැවිලි ප්‍රදේශයන්හි භූමි සහ ජල මූලාශ්‍රවල භෞතික තත්ත්වය පහත වැටීම් අවම කිරීමේ සහ පරිසර දූෂණය තුරන් කිරීමේ ද අරමුණින් නිවාරක සහ ප්‍රතිකර්මීය යන දෙයාකාරයෙන්ම වූ සංරක්ෂණ පියවර ශක්තිමත් කිරීම.
11. ජාතික ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විමසා හඳුනාගත් ප්‍රදේශවල උවදුරු සහිත ප්‍රදේශ හඳුනාගැනීම සහ නේවාසික කාර්ය සඳහා නීති විරෝධී ලෙස පදිංචිවීම්වලින් ආරක්ෂා කරගනිමින් ඒවා විකල්ප ඵලදායී භාවිතයට යොදා ගැනීම.
12. වැවිලි ප්‍රදේශවල ප්‍රමාණවත් සමාජ සේවා පහසුකම් හා සහ තිරසාර යටිතල පහසුකම් සැලසීම ප්‍රවර්ධනය.

**1.6.1.5 අධිකාරියේ කළමනාකරණය**

වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ කළමනාකරණය සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයින් සංඛ්‍යාව 07 කි.

1. වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්
2. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන නිලධරයෙක්
3. වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්
4. පොදු ව්‍යාවසාය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්
5. පළාත් සභා සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්
6. නිවාස හා ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්
7. ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අමාත්‍යාංශ නිලධරයෙක්

එයට අමතරව, ප්‍රජා සවිබල ගැන්වීම් හා වතුයටිතල පහසුකම් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, මූල්‍ය හා පළාත් පරිපාලනය යන අංශයන්හි ප්‍රවීණතාවක් දක්වන පුද්ගලයන් අතුරින් පත්කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුද මෙම කළමනාකරණ මණ්ඩලයට එක්වේ. මින් එක් සාමාජිකයෙකු වැවිලි සමාගම් නියෝජනය කිරීම සඳහා ලංකා වැවිලිකරුවන්ගේ සංගමයෙන් පත්කරනු ලැබිය යුතුය. අධිකාරියේ සභාපති හා උප සභාපති වන්නේද අමාත්‍යවරයා විසින් පත්කල සාමාජිකයින් අතුරින් දෙදෙනෙකි.

"අධ්‍යක්ෂ ජනරාල්" අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර ඔහු, විෂය භාර අමාත්‍යාවරයා විසින් පාලක මණ්ඩලයේ නිර්දේශය මත පත් කරනු ලබයි. අධ්‍යක්ෂ ජනරාල් විසින් කාර්ය මණ්ඩලයේ පරිපාලනය අතුළුව අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම භාරව කටයුතු කලයුතු අතර මණ්ඩලයේ සියළු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද වගකිව යුතුය. එමෙන්ම මණ්ඩලය විසින් ඔහුට පවරන සියළු කර්තව්‍යයන් ඉටු කිරීමට බැඳී සිටින අතර මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන්ද ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන්ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු කල යුතුය.

මෙම අධිකාරිය එහි මෙහෙයුම් කටයුතු 2019 වර්ෂයේ පෙබරවාරි 7 වැනි දින සිට ආරම්භ කරන ලද අතර කළමනාකරණ මණ්ඩලය නිසි පරිදි පත්කර ඇත. 2019 වර්ෂයේ පෙබරවාරි සිට 2019 වර්ෂයේ නොවැම්බර් මස දක්වා සෑම මසකම කළමනාකරණ මණ්ඩල රැස්වීම් පවත්වා ඇත.

කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත, ගරු අමාත්‍යවරයා විසින් පනත ප්‍රකාරව 2019.03.01 දින සිට අධිකාරිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරන ලදී.

අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා කාණ්ඩ 14 ක් යටතේ තනතුරු 28 ක් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ඇත. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය හිමි නොවූ බැවින්ද ජනාධිපතිවරණය හේතුවෙන් සහ පසුව මුදල් අමාත්‍යාංශය විසින් බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් ද අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කිරීම හැරුනු කොට 2019 වර්ෂය තුලදී බඳවාගැනීම් කිසිවක් සිදු නොකරන ලදී.

**1.6.1.6 2019.12.31 දිනට අධිකාරියේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය**

| අනු අංකය | තනතුර | සේවය/වැටුප් කේතය | වැටුප් පංතිය | අනුමත කාර්ය මණ්ඩලය | | තත්‍ය කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් / කොන්ත්‍රාත් | |
| 1. | අධ්‍යක්ෂ ජෙනරාල් | HM 1-3-2016 | | 01 | | - | 01 | - |
| 2. | අධ්‍යක්ෂ | HM 1-1-2016 | | 02 | | - | | 02 |
| 3. | ප්‍රාදේශීය අධ්‍යක්ෂ | MM 1-3-2016 | II | 01 | | - | | 01 |
| 4. | සහකාර අධ්‍යක්ෂ | MM 1-1-2016 | II | 02 | | - | | 02 |
| 5. | ගණකාධිකාරී | MM 1-1-2016 | II | 01 | | - | | 01 |
| 6. | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / නීති නිලධාරී | MM 1-1-2016 | II | 01 | | - | | 01 |
| 7. | පරිපාලන නිලධාරී | JM 1-1-2016 | II | 01 | | - | | 01 |
| 8. | තාක්ෂණ නිලධාරී | JM 1-1-2016 | II | 02 | | - | | 02 |
| 9. | භාෂා පරිවර්තක | MA 4-2016 | III | 02 | | - | | 02 |
| 10. | සහකාර ගණකාධිකාරී | MA-2-1-2016 | III | 01 | | - | | 01 |
| 11. | සංවර්ධන නිලධාරී | MA 3-2016 | III | 02 | | - | | 02 |
| 12. | කළමණාකරණ සහකාර | MA 1-2-2016 | III | 03 | | - | | 03 |
| 13. | රියදුරු | PL 3-2016 | III | 04 | | - | | 04 |
| 14. | කාර්යාල කාර්ය සහායක | PL 1-2016 | III | 05 | | - | | 05 |
| එකතුව | | | | 28 | - | - | 1 | 27 |

### 1.6.1.7 අධිකාරියේ කාර්යසාධනය

#### 1.6.1.7.1 2019.12.31 දිනට අධිකාරියේ මූල්‍ය කටයුතු

අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු අතර මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේය. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කළයුතු අතර රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතුය.

සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වීමෙන් සය මසක් ඇතුලත විගණනය කරන ලද ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව ද, ඉදිරි වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාව ද ඇතුලත්ව සකස් කරන ලද වාර්ෂික වාර්තාව විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කල යුතුය. අමාත්‍යවරයා විසින් එම වාර්තාව ලැබුන දින සිට සය මසක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2019.12.31 දින වනවිට අධිකාරියට නිශ්චිත ගණකාධිකාරී වරයෙක් පත්කොට නොතිබූ අතර අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් වැඩ බැලීම සිදු කරන ලදී.

#### 1.6.1.7.2. 2019.12.31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රගතිය

වැවිලි ප්‍රදේශයන්හි අලුතින් විවෘත කරන ලද ගම්මානවල යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු සඳහා 2019 වර්ෂයේ දී රුපියල් මිලියන 4,000 ක් වෙන් කරන ලෙස අධිකාරිය ඉල්ලා සිටින ලද නමුදු මුදල් අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය තුලදී සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැත.

අධිකාරිය පිහිටුවීම සඳහා රුපියල් මිලියන 03ක මූලික ප්‍රතිපාදන අමාත්‍යාංශයට නිදහස් කරන ලද අතර එය අධිකාරිය සඳහා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සෘජුවම වියදම් කර ඇත. 2019 වර්ෂය සඳහා රු.මිලියන 2.5 ක මුදලක් අධිකාරියේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද අතර 2019 වර්ෂය තුලදී එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 2.0 කි.

| 2019.12.31 දිනට අධිකාරියේ සමස්ථ වියදම | | | |
|---|---|---|---|
| | පුනරාවර්තන වියදම (රු. මි.) | ප්‍රාග්ධන වියදම් (රු. මි.) | |
| | | කාර්යාලයීය සංවර්ධන වියදම් | විශේෂ ව්‍යාපෘති |
| පුද්ගල පඩිනඩි | 1.99 | - | - |
| සාමාන්‍ය පරිපාලනය | 0.01 | - | - |
| ප්‍රාග්ධන වියදම | | 3.00 | |
| මුළු එකතුව | 2.00 | 3.00 | - |

#### 1.6.1.7.3. 2019.12.31 දිනට සංවර්ධන කටයුතුවල ප්‍රගතිය

වැවිලි ප්‍රදේශයන්හි ස්ථාපනය කරන ලද නව ගම්මානවල යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේදී රුපියල් මිලියන 4,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අධිකාරිය විසින් අපේක්ෂා කලද, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවූ බැවින් කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොමැති අතර පහත දක්වා ඇති මෙහෙයුම් කටයුතු පමණක් 2019 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදී.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු දෙකක අමාත්‍යාංශය විසින් පවරා ඇති නියමු නිවාස ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තා ලබාගැනීම, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ සෘජු ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් පරිපාටිය හරහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සිදු කෙරිණි. කෙසේ වෙතත්, අමාත්‍යධූර වල සිදුවූ වෙනස්කම් හේතුවෙන් මෙම කටයුතු ආරම්භ නොකෙරිණි. 2015 ට පෙර වතු කම්කරුවන් විසින් ලබා ගත් නිවාස ණය සම්බන්ධයෙන් දත්ත 3,000 කට අධික සංඛ්‍යාවක් දැනටමත් සිදුකරන ලද සමීක්ෂණයක් මඟින් එකතු කර ඇති අතර ණය ලබාදී ඇති අදාළ අමාත්‍යාංශ සහ ආයතන (NHDA වැනි) සමඟ දැනටමත් එකතු කර ඇති දත්ත තහවුරු කර ගැනීමට පියවර ගෙන තිබේ. නිවාස ඉදිකර ඇති නිවාස හිමියන්ට සහ ණය සම්පූර්ණයෙන් ගෙවා ඇති නමුත් ඉඩම සඳහා ඔප්පු නිකුත් නොකරන ලද නිවාස හිමියන්ට හිමිකම් ඔප්පු නිකුත් කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙය සිදුකර ඇත. මෙය මෙම අධිකාරියට පවරා ඇති එක් කාර්යයක් වන අතර එය අඛණ්ඩව සිදු කල යුතුය.

### 1.6.2 වැවිලි මානව සංවර්ධන භාරය

"වැවිලි මානව සංවර්ධන භාරය", වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ, "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" නමින් 1992 සැප්තැම්බර් මස 18 වන දින ස්ථාපිත කරන ලද සමාගමකි.
1992 දී රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් වතු පවරාගෙන එම වතුවල කළමණාකාරීත්වය ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් යටතේ පුද්ගලික අංශය වෙත පවරාදෙන ලදී.

2002 ඔක්තෝම්බර් මස 25 වන දින, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ සමාජ අංශ ඒකාබද්ධ කරමින් වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ සෞඛ්‍ය සහ අනෙකුත් සමාජ සුභ සාධන කටයුතු මෙන්ම ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම උදෙසා "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය", "වැවිලි මානව සංවර්ධන භාරය" ලෙස ප්‍රතිනාම ගත කරන ලදී. මේ වන විට මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

"වැවිලි මානව සංවර්ධන භාරය වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවකගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින්, ඊට අවශ්‍ය පහසුකම් සලසාදීම උදෙසා ක්‍රියාකරන, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛපාර්ශ්වික ආයතනයකි.

වතු ප්‍රජාවගේ යහපත උදෙසා පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ඇතුළු, ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. මෙහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවතේ පිහිටා ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ මෙහෙයවීම යටතේ පවත්වාගෙන යනු ලැබේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල හතක් මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කෙරේ. ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානියා වන අතර, තාක්ෂණික මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලය ඔහුට සහාය සලසයි.


#### 1.6.2.1 වැවිලි මානව සංවර්ධන භාරයේ මූලික පරමාර්ථ

ශ්‍රී ලංකාවේ වතු ඉඩම් හා ආශ්‍රිත කර්මාන්ත හා සේවා වල නියුතු වතු සේවක ප්‍රජාවගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය වැඩිදියුණු කිරීම, දුප්පත්කම තුරන් කිරීම, නිවාස හා නේවාසික පහසුකම් සැපයීම, අධ්‍යාපනය හා දැනුම දියුණු කිරීම, ජීවිතයේ ගුණාත්මකභාවය සහ ජීවන තත්වය වැඩිදියුණු කිරීම.

උක්ත පරමාර්ථ සාක්ෂාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරයි.

- වතු ප්‍රජාවේ පේලි නිවාස වෙනුවට ස්වයං අයිතිය සතු නිවාස ( තනි නිවාස / තට්ටු නිවාස) සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම.
- පැරණි පේලි නිවාස අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහලවල් නැවත සෙවිලි කිරීම (re-roofing).
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සුදුසුකම් ලත් ළමා සංවර්ධන නිලධාරීන් හඳුන්වා දීම.
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (මාර්ග / ගොඩනැගිලි / ආගමික මධ්‍යස්ථාන යනාදිය)
- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු
- අලෙවි පහසුකම් සලසා දීම
- ජීවනෝපාය මාර්ග සඳහා පහසුකම් සළසා දීම
- හදිසි ආපදා තත්ත්වයන්හිදී පහසුකම් සපයන ආයතනයක් ලෙස කටයුතු කිරීම

1.6.2.2 වැවිලි මානව සංවර්ධන භාරයේ සංවිධාන ව්‍යුහය



### 1.6.2.3 වැවිලි මානව සංවර්ධන භාරය හා සම්බන්ධිත ආයතන - වතු සේවක නිවාස සමූපකාර සමිතිය

වතු පුද්ගලික අංශය වෙත පැවරීමේදී වතු සේවකයින්ගේ සුභ සාධනය උදෙසා එවකට රජය මගින් ගත් ප්‍රතිපත්ති තීරණයක් මත වතු සේවක නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 වසරේදී පිහිටුවන ලදී. මූලික වශයෙන් වතු සේවකයින්ගේ සුභ සාධනය උදෙසා පිහිටුවන ලද මෙම සමිති, මේ වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතුයායවල් 435 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මෙම සමූපකාර සමිති බොහොමයක්, ප්‍රමුඛ ප්‍රජා මූල සංවිධාන ලෙස රට තුළ ස්ථාපනය වී ඇත. ඒවා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ නිර්ණායක මත පදනම් වූ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක් කර ඇති අතර, ඒවා නිරන්තර සුපරීක්ෂාවට භාජනය වේ. වැවිලි ක්ෂේත්‍රයේ වෙසෙන වතු සේවකයින්ගෙන් 99 % පමණ මෙහි සාමාජිකයින් වන අතර වර්තමානයේදී රු. 250.00 මාසික සාමාජික ගාස්තුවක් සෑම සාමාජිකයෙකු විසින්ම ගෙවනු ලබයි. වතු සේවකයින් විශ්‍රාම ගියද බොහෝවිට මෙම සමිති තුල යාවජීව සාමාජිකයන් ලෙස කටයුතු කරනුයේ ඉන් ඔවුන් වෙත ලැබෙන ප්‍රතිලාභ ඉහල බැවිනි.

වතු නිවාස ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක ප්‍රතිලාභී මූලික නිවාස ඉදිකිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම කාර්යභාරයක් මෙම සමිති මගින් ඉටු කරනු ලබන අතර රජය විසින් වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් ලබාදෙන බොහොමයක් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරනු ලබන්නේද වතු සේවක නිවාස සමූපකාර සමිති මගිනි. එමෙන්ම වතු සේවක නිවාස සමූපකාර සමිති" (වනිස) බැංකුව" යන නමින් ඔවුන්ගේම බැංකු හරහා සිය අරමුදල් උපදවාගනු ලබන අතර, ණය මුදල් සපයා දීමට ද කටයුතු කරයි.

ණය සැපයීමට අමතරව, රැකියා අවස්ථා ද උදා කරමින්, වතුවල පදිංචි නිවැසියන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතා සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙමින්, සමූපකාර සමිති, සිල්ලර භාණ්ඩ / ශුභසාධන වෙළඳසැල්, බාබර් සැලුන් හා සන්නිවේදන මධ්‍යස්ථාන යනාදී ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසා ඇත. වතු නිවැසියන්ගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, සනීපාරක්ෂාව හා පවිත්‍රතාව යනාදිය ඉහළ නැංවීම පිණිස ඔවුනට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා පහසුවෙන් ඔවුන් වෙත ළඟාකර දීම සඳහා, වතු සේවක නිවාස සමූපකාර සමිති තම උප නියෝජිතයන් ලෙස යොදාගනිමින් "වැවිලි මානව සංවර්ධන භාරය", බහු ජාතික සමාගම් සහ වෙනත් ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සංවිධාන සමග ද ඒකාබද්ධව මෙම ආයතන වැඩිදියුණු කිරීමට කටයුතු කරයි.

### 1.6.2.4 වැවිලිමානව සංවර්ධන භාරය මගින් මෙම අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් / ව්‍යාපෘති

මෙරට ආර්ථිකය නගා සිටුවීමට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික අංශයන්ගේ උන්නතිය සඳහා වැවිලි ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය වැදගත් අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. මෙම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මෙම අමාත්‍යාංශය නායකත්වය ගෙන ක්‍රියා කරන අතර, එහි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානම හවුල්කාර පාර්ශ්වය ලෙසට වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියා කරනු ලබයි. ඒ සඳහා අමාත්‍යාංශය විසින් වැවිලි සංවර්ධන භාරය වෙත පරිපාලන දීමනාවක් ලබාදෙනු ලැබේ. ඒ අනුව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ

- වැවිලි ප්‍රජාව ඉලක්ක කොට නව නිවාස ඉදිකිරීම
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම
- සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම
- පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම හා සංවර්ධනය
- ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් "ටිකිරි ශක්ති" පෝෂණ වැඩසටහනේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශය මඟින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා සහය ලබාදීම

වැනි වැඩසටහන් ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම හා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම මෙම ආයතන මගින් සිදු කරයි.

අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය සඳහා වැවිලි ප්‍රජාව ඉලක්ක කොට නව නිවාස ඒකක 250 ක් ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එම නිවාස ඉදිකිරීම් සඳහා සුදුසු ඉඩම් කට්ටි තෝරා ගැනීම හා NBRO වාර්තා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම අවිච්ඡේදව පැවැති නිවාස ඉදිකිරීම් සම්පූර්ණ කිරීමේ කටයුතු වෙනුවෙන් වැවිලි මානව සංවර්ධන භාරය විසින් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක විය. ඉන් නිවාස 428 ක

ඉදිකිරීම් වර්ෂය අවසන් වන විට නිමවී ඇති අතර ඉතිරි නිවාස ඉදිරි වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය. මෙම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එක් නිවසක් සඳහා 7% ක පරිපාලන දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ

එමෙන්ම, ඉන්දියානු ආධාර මගින් සිදුකරනු ලබන නිවාස ව්‍යාපෘතියේ විදුලිය, ජලය හා ප්‍රවේශ මාර්ග සංවර්ධනය වැනි යටිතල පහසුකම් සංවර්ධනය වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදු කරනු ලබන අතර වැඩ අවසන් කරන ලද නිවාස ඒකක 699 ක් වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදුකිරීම 2019 වර්ෂය තුලදී සිදු කරන ලදී.

මීට අමතරව, පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතින් ක්‍රියාවට නැංවීම සඳහා ද, වැඩි දායකත්වයක් දරනු ලබන්නේ වැවිලි මානව සංවර්ධන භාරයයි. එමෙන්ම, ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් "ටිකිරි ශක්ති" පෝෂණ වැඩසටහන ද වැවිලි මානව සංවර්ධන භාරයේ අධීක්ෂණය යටතේ වතු ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කර ඇත.

තවද, ජාතික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති දිළිඳුකම තුරන් කිරීම, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහල නැංවීම, වකුගඩු රෝග මැඩලීම, මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්ෂණය, ජල මූලාශ්‍ර සංරක්ෂණය වැනි අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ද වැවිලි මානව සංවර්ධන භාරය සුවිශාල දායකත්වයක් සලසනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 4% පරිපාලන දීමනාවක් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවනු ලබයි.

#### 1.6.2.5 2019.12.31 දිනට වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබාදී ඇති මුදල් ප්‍රමාණය

| | වැඩසටහන | ලබාදී ඇති මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය සංවර්ධනය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම | 19.07 |
| 2 | පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය | 149.43 |
| 3 | වතු නිවාස වැඩසටහන | 785.46 |
| 4 | ඉන්දීය රජයේ ආධාර මත සිදු කරන නිවාස වැඩසටහන | 43.54 |
| | මුළු එකතුව | 997.51 |

### 1.6.3 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

"සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම" 2005 වර්ෂයේදී, 2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරන ලද අතර ආරම්භයේ සිට මේ දක්වා විවිධ අමාත්‍යාංශවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

- වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය (වර්ෂ 2005)
- තරුණ කටයුතු හා සාමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (වර්ෂ 2006 - 2009)
- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය (වර්ෂ 2010 - 2014)
- සමාජ ආර්ථික, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (වර්ෂ 2015 ජනවාරි මස සිට 2015 අගෝස්තු මස දක්වා)
- කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය (වර්ෂ 2015 සැප්තැම්බර් මස 2019 දෙසැම්බර් මස 09 දින දක්වා)
- ප්‍රජා සවිබල ගැන්වීම් හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (වර්ෂ 2019 දෙසැම්බර් මස 10 දින සිට මේ දක්වා)

#### 1.6.3.1 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ අරමුණු

(අ) ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාව අතර සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම
(ආ) ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම
(ඇ) ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීමය, සමාජයීය, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

(ඇ) ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය හා සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල දැනීම හා අවබෝධය නංවාලීම

(ඉ) ආර්ථික වශයෙන් හා සමාජයීය වශයෙන් අවාසියට ලක් වූ යම් තැනැත්තකුගේ වාසස්ථාන වැඩිදියුණු කිරීම සහ යටිතල පහසුකම් සැපයීමද ඇතුළුව ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම

(ඊ) උචිත බැංකුවල හා මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමට ශ්‍රී ලාංකිකයන් ධෛර්යමත් කිරීම

(උ) පදනමේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ දේශීය විදේශීය ආයතන සමඟ සබඳතා ඇතිකර ගැනීම

(ඌ) පදනමේ පරමාර්ථ කිසිවකට සමාන යම් කටයුත්තක නිරතව සිටින යම් තැනැත්තෙකුට මූල්‍ය හෝ වෙනත් ආධාර සැපයීම

(එ) ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජයීය ක්ෂේත්‍ර පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

(ඒ) ශ්‍රී ලාංකිකයන් අතර මානව අයිතිවාසිකම්, යුතුකම් හා යුක්තියට ප්‍රවේශවීම ආදිය පිළිබඳව දැනීමක් ඇතිකිරීම සඳහා වූ වැඩසටහන් සංවිධානය කිරීම


(ඔ) ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රීඩා හා විනෝදාංශ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම

(ඕ) පදනමේ පරමාර්ථ ඊකගැනීම සඳහා සහ සුදුසු යැයි මණ්ඩලය සලකන වෙනත් යම් කාර්යයක් සඳහා, රම්බොඩ තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය හා හැටන්හි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම හා ප්‍රයෝජනයට ගැනීම එසේ වුවද, රම්බොඩ තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය හා හැටන්හි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යම් දේශපාලන කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතුය.

(ක) ඉහත සියළු පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වියහැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

# සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනමේ සංවිධාන සටහන

<u>සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනමේ සංවිධාන සටහන</u>



#### 1.6.3.2 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රගතිය

අමාත්‍යාංශය විසින් සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ ප්‍රාග්ධන හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මි. 122 ක් වෙන්කර ඇති අතර 2019 දෙසැම්බර් මස අවසන් වනවිට එහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 121 කි. සමස්ථ මූල්‍ය ප්‍රගතිය 99.% කි.

| වියදම් අයිතමය | වෙන්කල ප්‍රතිපාදන 2019 (රු.මි.) | මධ්‍යස්ථාන අතර වියදම (රු.මි.) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රධාන කාර්යාලය | පුස්සා ශක්ති මධ්‍යස්ථාන | TVTC හැටන් | තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය | තොණ්ඩමන් නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය | 2019 වර්ෂය සඳහා මුළු වියදම (රු.මි.) |
| ගමන් සහ ප්‍රවාහන | 0.12 | - | - | 0.03 | - | - | 0.03 |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2.50 | - | - | 1.08 | - | - | 1.08 |
| ඉන්ධන | 0.55 | - | - | 0.21 | - | - | 0.21 |
| වාහන නඩත්තුව සහ අළුත්වැඩියාව | 0.65 | - | - | 0.05 | - | - | 0.05 |
| ගොඩනැගිලි නඩත්තුව | 0.12 | - | - | 0.25 | - | - | 0.25 |
| යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීම | 0.20 | - | - | 0.65 | 0.24 | - | 0.89 |
| තැපැල් හා සන්නිවේදනය | 0.52 | 0.07 | - | 0.14 | 0.04 | 0.02 | 0.27 |
| ජලය සහ විදුලිය | 2.90 | - | 0.33 | 0.67 | 0.57 | 0.04 | 1.60 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 98.65 | 7.29 | 57.10 | 23.52 | 4.48 | 3.50 | 95.90 |
| ආහාර සහ නිල ඇඳුම් | 6.85 | - | - | 7.76 | - | - | 7.76 |
| පුහුණු අමුද්‍රව්‍ය, නිල ඇඳුම්, ඇඳුම් පැළඳුම් | 3.10 | - | - | 4.09 | - | - | 4.09 |
| කුලී සහ බදු | 0.10 | - | - | 0.06 | 0.04 | - | 0.09 |
| සමාජ හා සුභසාධන වැඩසටහන් සහ වෙනත් ක්‍රියාකාරම් | 0.98 | - | 0.62 | 0.45 | - | 0.03 | 1.10 |
| ආරක්ෂාව ඇතුළුව වෙනත් පුනරාවර්තන වියදම් | 4.76 | 0.34 | 2.25 | 2.87 | 1.25 | 1.26 | 7.98 |
| මුළු එකතුව | 122.00 | 7.71 | 60.31 | 41.83 | 6.61 | 4.84 | 121.29 |

#### 1.6.3.3 හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය -

මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සතුව, වසරකට සිසුන් 400 ක් පමණ පුහුණු කිරීම් සඳහා ඉඩකඩ පවතින අතර පුහුණුව සඳහා සහභාගීවන සිසුන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් හා ආහාරපාන නොමිලේ දෙනු ලබයි.

තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධස්ථානය මගින් දැනට වෘත්තීය පුහුණු පාඨමාලා 11 ක් ක්‍රියාත්මක කරනු ලබන අතර. ඒ සඳහා වාර්ෂික පාඨමාලා 03 ක් හා සය මාසික පුහුණු පාඨමාලා 08 ක් ඇතුලත් වේ. අර්ධ වාර්ෂික පුහුණු පාඨමාලා සඳහා වසරකට කාණ්ඩ දෙකක් යටතේ බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය මගින් සලසා දී ඇත. එම පාඨමාලා පහත පරිදි වේ.

#### 1.6.3.4 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වෘත්තීය පුහුණු පාඨමාලා

| අංකය | පාඨමාලාව | පාඨමාලා කාලය |
|---|---|---|
| 1. | මෝටර් රථ කාර්මික ශිල්පය | අවුරුදු 01 යි |
| 2. | විදුලි කාර්මික | අවුරුදු 01 යි |
| 3. | යන්ත්‍රෝපකරණ | අවුරුදු 01 යි |
| 4. | ඇලුමිනියම් පිරිසැකසුම් කිරීම | මාස 06 යි |

| | | |
|---|---|---|
| 5. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | මාස 06 යි |
| 6. | ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියාව | මාස 06 යි |
| 7. | යතුරුපැදි කාර්මික | මාස 06 යි |
| 8. | වෙල්ඩර් (පෑස්සුම් ශිල්පය) | මාස 06 යි |
| 9. | වඩු කාර්මික | මාස 06 යි |
| 10. | මැහුම් ශිල්පය | මාස 06 යි |
| 11. | හෝටල් කළමනාකරණය | මාස 06 යි |

මෙම පුහුණු පාඨමාලා සඳහා සහභාගී වන සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉංග්‍රීසි අධ්‍යාපනයද ලබාදෙනු ලබන අතර සියළුම පාඨමාලාවන් අවසානයේදී ඒ සඳහා පරීක්ෂණ පවත්වා අතර පාඨමාලාව නිසි පරිදි අවසන් කරන ලද සිසුන් සඳහා සහතිකපත් ලබාදෙනු ලැබේ.

**1.6.3.5 2019.12.31 දිනට පුහුණුව ලැබූ සිසුන් පිළිබඳ තොරතුරු**

| අංකය | පාඨමාලාව | පාඨමාලා කාලය | පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | පුහුණුව ලබාදීමට අපේක්ෂා කල සිසුන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව | පුහුණුව අවසන් කල සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | මෝටර් රථ කාර්මික ශිල්පය | අවුරුදු 01 යි | 1 | 20 | 25 | 12 |
| 2. | විදුලි කාර්මික | අවුරුදු 01 යි | 1 | 20 | 16 | 12 |
| 3. | යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | අවුරුදු 01 යි | 1 | 15 | 10 | 7 |
| 4. | ඇලුමිනියම් පිරිසැකසුම් කිරීම | මාස 06 යි | 2 | 50 | 24 | 25 |
| 5. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | මාස 06 යි | 2 | 40 | 17 | 22 |
| 6. | ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියාව | මාස 06 යි | 2 | 50 | 11 | 17 |
| 7. | යතුරුපැදි කාර්මික | මාස 06 යි | 2 | 40 | 26 | 35 |
| 8. | වෙල්ඩර් (පෑස්සුම් ශිල්පය) | මාස 06 යි | 2 | 50 | 21 | 9 |
| 9. | වඩු කාර්මික | මාස 06 යි | 2 | 40 | 13 | 10 |
| 10. | මැහුම් ශිල්පය | මාස 06 යි | 2 | 40 | 38 | 49 |
| 11. | හෝටල් කළමනාකරණය | මාස 06 යි | 2 | 40 | 20 | 40 |

**1.6.3.6 රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය**

අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික අභිමතාර්ථයන් හා පිළිවෙත් වර්ධනය කිරීමේ අදහසින් මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත. 2012 වසරේ සිට කර්නාටක සංගීතය, වීනා වාදනය, මෘදුකාංග හා වයලීන් වාදනය පිළිබඳව ආචාර්යවරයකුගේ පූර්ණ කාලීන අධීක්ෂණය යටතේ පාඨමාලා පවත්වමින් පැවතියද එම ක්‍රියාකාරකම් තාවකාලිකව නතර වී ඇත. මීට අමතරව, විවිධ උත්සව හා සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම සඳහා ශාලා පහසුකම් සැපයීමද මෙමගින් සිදු කරනු ලබන අතර එමගින් 2019 වර්ෂයේ උපයා ඇති අදායම රු.මි. 0.25 කි.

**1.6.3.7 නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය**

මෙම ක්‍රීඩා සංකීර්ණය 2005 වර්ෂයේදී, සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම වෙත පවරා දී ඇති අතර ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් 2011 වසරේදී රු: මි. 25 ක මුදලක් වැය කර ක්‍රීඩා පිටිය සංවර්ධනය කර ඇත.

ක්‍රීඩා සංකීර්ණයෙන් ප්‍රතිලාභ ලබන තරුණ තරුණියන්ගේ කායික හා මානසික සංවර්ධනය වෙනුවෙන් කාය ශක්ති මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති අතර ටෙනිස්, බැඩ්මින්ටන්, නෙට්බෝල්, වොලිබෝල් ආදී ගෘහස්ථ ක්‍රීඩා සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ද, ක්‍රිකට් වැනි ක්‍රීඩා සඳහා එළිමහන් ක්‍රිඩාගාරයක් ද ප්‍රශස්ථ මට්ටමෙන් ක්‍රියාත්මක වේ.

අවට පාසල් හා රාජ්‍ය ආයතන රාශියක්ද විවිධ ක්‍රීඩා තරඟ හා ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා මෙම ක්‍රීඩා සංකීර්ණය යොදා ගනු ලබයි.

### 1.6.3.8 ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය (E- KIOSK Centres)

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිතා කරමින් අඩු වරප්‍රසාද ලත් ජන කොටස් වෙත පූර්ණවූත්, විස්තීර්ණවූත් සමාජ ආර්ථික සංවර්ධනයක් හිමිකර දීම මෙම ව්‍යාපෘතියේ අභිලාෂය වේ. ඒ සඳහා ප්‍රජාවට තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය ලබාදීම අරමුණු කොට ගනිමින් වැවිලි ප්‍රදේශ ආවරණය වන පරිදි 2006 වසරේදී ආරම්භ කරන ලද ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය, නුවරඑළිය, බදුල්ල, මහනුවර, කෑගල්ල, රත්නපුර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති ප්‍රජාශක්ති මධ්‍යස්ථාන (E- KIOSK Centres) 44 ක් හරහා ක්‍රියාත්මක වේ.

ග්‍රාමීය හා වතු ප්‍රදේශයන්හි පළමු වසරේ සිට උසස් අධ්‍යාපනයන් හදාරන ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ටද, පාසල් හැර ගිය තරුණ - තරුණියන්ටද තොරතුරු තාක්ෂණ සන්නිවේදනය ලබාදීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ක්‍රියා කරනු ලබයි. එසේම අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වන්නන් සඳහා නොමිලේ එම පහසුකම් ලබා දීමටද, පුස්තකාල පහසුකම් සැපයීම තුලින් ඔවුන්ගේ කියවීම හා - දැනුම වර්ධනයටද, කවි නාට්‍ය හා කථික තරඟ තුලින් පෞරුෂත්ව සංවර්ධනයටද මෙම මධ්‍යස්ථානය හරහා පහසුකම් සලසා තිබේ. එමෙන්ම විවිධ වැඩමුළු හා දේශණ පැවැත්වීමත්, විවිධ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙමගින් සිදුකරනු ලබයි.

එමෙන්ම සෞඛ්‍ය, කාන්තා සවිබල ගැන්වීම, පාරිසරික ගැටළු, ස්වයං රැකියා, වතුකරයේ ළමුන් සම්බන්ධයෙන් බලපාන විවිධ ගැටළු, අභිප්‍රේරණ ක්‍රියාකාරකම් (ප්‍රදර්ශනය, පාසල් හැරයාම අඩු කිරීමට ආදිය) යනාදී විවිධ තේමාවන් ඔස්සේ වතු ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය මගින් විවිධ ප්‍රජා මූලික ක්‍රියාකාරකම් දියත් කෙරෙන අතර විශේෂයෙන්ම අනෙකුත් ප්‍රජාවන් සමඟ සමානව ජීවත්වීම සඳහා වැවිලි ප්‍රජාව පරිනාමනය කිරීමට සහ ඔවුන්ගේ ආදායම (ස්වයං රැකියා) වැඩි කිරීමෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා ද ඇවැසි ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි.

### 1.6.3.9 දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන පිහිටීම

| දිස්ත්‍රික්කය | ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන පිහිටි වතු ප්‍රදේශ | | | |
|---|---|---|---|---|
| නුවරඑළිය | 1 වනරාජා<br>2 බ්‍රවුන්ස්වික්<br>3 කැරෝලිනා<br>4 ටිලිකුල්ට්‍රි | 5 ඩෙස්ෆෝර්ඩ්<br>6 ග්ලැසෝ<br>7 වටගොඩ<br>8 ඩන්සිනන් | 9 වෝල්ඩ්මාර්<br>10 ලිඩ්ස්ඩේල්<br>11 වෙදමුල්ල<br>12 හන්ගුරපිටිය | 13 පීඩෘ<br>14 කොටගල<br>15 ඩයගම නැගෙනහිර |
| බදුල්ල | 1 පුනගල<br>2 හිඳගල<br>3 යූරි | 4 අඩාවත්ත<br>5 හොප්ටන් | 6 වැලිමඩ<br>7 රෝබරි | 8 ග්ලෙනෝර්<br>9 සාරනියා |
| රත්නපුර | 1 බලන්ගොඩ<br>2 ඇහැලියගොඩ | 3 මාදම්බේ | 4 හුනුවැල්ල | 5 හේස්<br>6 හවුපේ |
| මහනුවර | 1 මෙල්ෆර්ඩ්<br>2 ඩක්වරි | 3 ගලහ<br>4 කැලෑබොක්ක | 5 පාතදුම්බර | 6 වෙස්ට්හෝල් |
| කළුතර | 1 මිල්ලකන්ද | | | |
| මොණරාගල | 1 කුමාරවත්ත | | | |
| ගාල්ල | 1 දිවිතුර | | | |
| මාතර | 1 කිරුවානාගඟ | | | |
| කෑගල්ල | 1 අටාලේ | 2 මියනවිට | 3 කැලණි | 4 මොරලිඔය |
| මාතලේ | | | | |

ප්‍රජාශක්ති මධ්‍යස්ථාන (E-KIOSK Centers) 45 අතුරින් 44 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි හවුපේ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන දැනට ක්‍රියාත්මක නොවේ.

#### 1.6.3.9 ප්‍රජාශක්ති මධ්‍යස්ථාන හරහා සිදුකරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්වල සාරාංශය

| අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ICT වැඩසටහන | 16 | 824 |
| 2 | සමාජ ක්‍රියාකාරකම් | 10 | 483 |
| 3 | සැමරීම් | 13 | 418 |
| 4 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 34 | 1904 |
| 5 | වෛද්‍ය වැඩසටහන් | 10 | 684 |
| 6 | පුහුණු/ස්වයං රැකියා | 28 | 963 |
| 7 | කාබනික වගාව | 8 | 286 |
| 8 | පාසල් සම්මන්ත්‍රණ | 9 | 587 |
| 9 | කුසලතා සංවර්ධනය | 3 | 265 |
| 10 | ක්‍රීඩා ක්‍රියාකාරකම් | 3 | 121 |
| 11 | කාන්තාවන් සවිබලගැන්වීම | 7 | 328 |
| | මුළු එකතුව | 141 | 6,863 |

### 1.6.4 වතු අංශයේ තරුණ තරුණියන් සඳහා වන ස්වයං රැකියා සඳහා ණය ලබාදීමේ චක්‍රීය ණය අරමුදල

ඉහළම දරිද්‍රතා අගයන් පිළිබිඹු කරනු ලබන වැවිලි ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම උදෙසා, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයේ මුඛ්‍ය පරමාර්ථයක් වේ. විශේෂයෙන්ම ශ්‍රම බලකායේ පුලුල් පරාසයක් ගන්නා තරුණ කොටස් සමාජ සවිබල ගැන්වීම උදෙසා අමාත්‍යාංශය මගින් විවිධ ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව වැවිලි ක්ෂේත්‍රයේ තරුණ තරුණියන්ගේ රැකියා අවස්ථා පුළුල් කිරීමේ අරමුණින් ස්වයං රැකියා වැඩසටහන් සඳහා ඔවුන් යොමු කිරීමට අමාත්‍යාංශය සෘජුව කටයුතු කරනු ලබයි. නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික ඥානය හා පුහුණුව ලබාදීම, උපකරණ හා පහසුකම් ලබාදීම, ස්වයං රැකියා ණය ලබාදීම ආදිය තුලින් රැකියා අවස්ථා ජනිත කොට ඔවුන් සමාජයට වැඩදායී තෘප්තිමත් තරුණ කොටස් බවට පත් කිරීම පෙරදැරි කොට මෙම ව්‍යාපෘති දියත් කරනු ලබන අතර සුදුසු ස්වයං රැකියා හඳුනා ගැනීම, තරුණ තරුණියන් දැනුවත් කිරීම තුලින් ඔවුන් වෙත ස්වයං රැකියා හඳුන්වා දීමද ඒ අතුරින් ප්‍රමුඛ වේ.

හැටන්හි පිහිටා ඇති තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ද සම්බන්ධ කරගනිමින් තරුණ තරුණියන් සඳහා සිය ජීවනෝපාය මාර්ග සලසා ගැනීමට අවශ්‍ය වෘත්තීය දැනුම හා පුහුණුව ලබාදීම සිදුකරනු ලබයි. වැවිලි ප්‍රජාවගේ පවතින දරිද්‍රතා තත්ත්වය තුල ප්‍රායෝගික පුහුණුව ලද පමණින් ස්වයං රැකියා ආරම්භ කිරීමට නොහැකි බැවින් ඒ සඳහා විකල්පයක් වශයෙන් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මූල්‍යයෝත්පාදන මාර්ගයක් ලෙස මෙම චක්‍රීය ණය අරමුදල ආරම්භ කරන ලදී.

අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම මත ලංකා බැංකුව විසින් මෙම සක්‍රීය ණය අරමුදල පවත්වාගෙන යනු ලැබේ. එය අදියර දෙකකින් ක්‍රියාත්මක වූ අතර 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද දෙවන අදියර යටතේ නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි වැවිලි ක්ෂේත්‍ර මුල්කොට ගනිමින් තරුණ තරුණියන් 35 දෙනෙක් සඳහා ණය ලබා දී ඇත.

#### 1.6.4.1 ණය අරමුදල සඳහා ප්‍රතිලාභීන් තෝරාගනු ලබන ආකාරය

අපේක්ෂිත ව්‍යවසායකයා වැවිලි ප්‍රජාවට අයත් අවුරුදු 18 වැඩි අයකු විය යුතුය. ප්‍රථමයෙන්ම, ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරණු ලබන ණය අයදුම්පත්‍රය ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කොට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබයි, අමාත්‍යාංශයේ නිලධාරින් විසින් සුදුසු අයදුම්කරුවන් සම්මුඛ සාකච්ඡා මගින් තෝරා, එම අයදුම්පත්

අමාත්‍යාංශ නිර්දේශය සහිතව ලංකා බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලබයි. වතු අංශයේ ස්වයං රැකියා සඳහා වන ණය අරමුදලේ ගිවිසුම ප්‍රකාරව අවශ්‍යතා සපුරන අයදුම්කරුවන් වෙත බැංකුව විසින් ණය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එක් ප්‍රතිලාභියෙකු සඳහා ලබාදෙනු ලබන උපරිම ණය මුදල රු. 100,000 වන අතර ස්වයං රැකියාවේ ස්වභාවය අනුව ණය මුදල පූර්ණ වශයෙන් හෝ අදියර වශයෙන් ලබා දෙනු ලැබේ. ලංකා බැංකුවේ අදාල ප්‍රාදේශීය බැංකුව විසින් ස්වයං රැකියා පිළිබඳ පසු විපරම් කිරීම, එක් අදියරක ණය නිදහස්කල පසු ඊලඟ අදියර සඳහා ණය ලබා දීමේදී පෙර අදියර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීම ආදිය සිදු කරනු ලබයි.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

### 1.7.1 ව්‍යාපෘතියේ නමː

#### 1.7.1.(අ) ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

නායයෑම් වැනි ආපදා වලින් පීඩාවට පත්වන වැවිලි ප්‍රජාව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් පූර්ණ ප්‍රදාන පදනම යටතේ නිවාස ඒකක 14,000 ක් ලබාදීමට ඉන්දීය රජය විසින් අරමුදල් වෙන්කර ඇත.

මෙය අදියරයන් දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර (Stage 01) යටතේ නිවාස ඒකක 4,000 ක් හා දෙවන අදියර (Stage 02) යටතේ නිවාස ඒකක 10,000 ක් ක්‍රියාත්මක කරනු ලබයි. එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගතකර ඇති මෙම ව්‍යාපෘතිය සඳහා, එක් නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රුː 950,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රුː 30,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රුː 20,000/= ක ශ්‍රම දායකත්වයක් සපයනු ලබයි. නිවාස ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ප්‍රථම අදියරේ නිවාස සඳහා එක් නිවාස ඒකකයකට රුː 120,000/= බැගින් හා එහි දෙවන අදියරේ නිවාස සඳහා එක් නිවසකට රු.150,000/= බැගින් ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන සපයනු ලබයි.

#### 1.7.1.(අ) I ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය - පළමු අදියර (Stage I) - නිවාස 4000

2016.01.08 දිනැති කැබිනට් අනුමැතියට හා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2016.04.01 දින සිදු කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව ඌව සහ මධ්‍යම පළාත්වල වැවිලි ප්‍රජාව සඳහා පියවර 2 ක් ඔස්සේ (Phase) ඉන්දියානු නිවාස වැඩසටහනේ පළමු අදියර යටතේ වතු සේවක සමුපකාර සමිති (EWHCS) හරහා නිවාස ඒකක 4,000 ක් ඉදිකරනු ලැබේ. ඒ අනුව 2019.12.31 දිනවන විට නිවාස ඉදිකිරීම්හි ප්‍රගතිය පහත පරිදි වේ.

- පියවර I (Phase I) - නිවාස 1,057ක් ඉදිකිරීම් සම්පූර්ණ කර ඉන් නිවාස 699 ක් ප්‍රතිලාභීන් වෙත භාරදී ඇත.
- පියවර II (Phase II) - නිවාස 2,943ක් විවිධ ඉදිකිරීම් අදියරයන්හි ක්‍රියාත්මක වෙමින් පවතී.

#### 1.7.1.(අ) II ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය - දෙවන අදියර (Stage II) - නිවාස 10,000

II වන අදියර යටතේ ඉන්දීය රජය විසින් නව නිවාස 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත ලබා දීමට එකඟ වී ඇත. එයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය 2018.02.16 දින ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2018.08.12 දින ඊට අදාළ එකඟතා ගිවිසුමට එළඹෙන ලදී. ඒ අනුව, බදුල්ල, හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල, රත්නපුර සහ ගාල්ල යන වැවිලි කලාප හතේම වතු ප්‍රජාව සඳහා පියවර 2 කින් යුක්තව නිවාස ඒකක 10,000 ක් වතු සේවක සමුපකාර සමිති හරහා පහත පරිදි ඉදිකිරීමට සැලසුම් කර ඇත.

- පියවර I (Phase II) - නිවාස 5,000ක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති ලැයිස්තුව අවසන් කර ඇත.
- පියවර II (Phase II) - මේ යටතේ නිවාස 5,000ක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති ලැයිස්තුව හඳුනාගෙන අවසන් කළයුතුව ඇත.

**1.7.1 ආ) දායක නියෝජිතායතනයඃ ඉන්දීය රජය**

ඉන්දීය රජයේ මූල්‍යාධාර මත ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ මෙම නිවාස වැඩසටහනේ ප්‍රථම අදියර ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් තෝරාගත් පහත සඳහන් ක්‍රියාත්මක කිරීමේ ආයතනයන් හරහා සිදු කරනු ලබයි.

1. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat)
2. අන්තර්ජාතික රතු කුරුස සම්මේලනය (IFRC)
3. මනුෂ්‍යත්වය සඳහා නිවහන (Habitat for Humanity)
4. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA)

**1.7.1 ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි. 15,280**

- ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය අදියර I (නිවාස 4,000)
  ඉන්දියානු ආධාර රු.මි. 3,800
  රජයේ දායකත්වය රු.මි. 480

- ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය - අදියර II (නිවාස 10,000)
  ඉන්දියානු ආධාර රු.මි. 9,500
  රජයේ දායකත්වය රු.මි. 1,500

**1.7.1 ඈ) ව්‍යාපෘති කාල සීමාව - අවුරුදු 08 (2016 - 2024)**

**පළමු අදියර (Stage I)**
මේ යටතේ ඉදිකරනු ලබන ව්‍යාපෘති කාල සීමාව අවුරුදු 04 ක් වන අතර එය 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වන කාල පරිච්ඡේදය වේ.

එහෙත්, නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් හඳුනා ගැනීම, අත්පත් කරගැනීම, මිණුම් කිරීම, නිවාස ඉදිකිරීම සඳහා බිම් සැකසීම ආදියට හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමත වාර්තා ලබා ගැනීම (NBRO වාර්තා), ආදි කටයුතු සඳහා අපේක්ෂිත කාලසීමාවට වඩා දිගු කාලයක් ගතවීමත්, කාලගුණික හා දේශගුණික වැනි පාලනය කල නොහැකි සාධක හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වීම වැනි කරුණු හේතුකොටගෙන නියමිත කාල සීමාවේදී ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය. 2019 වර්ෂය අවසන්වනවිට නිවාස 1,057 ක වැඩ නිමකර ඇති අතර විවිධ ඉදිකිරීම් අදියරයන්හි පවතින ඉතිරි නිවාස 2,943 හි ඉදිකිරීම් 2020 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය.

**දෙවන අදියර (Stage II)**
අදියර II යටතේ ඉදිකිරීමට නියමිත නිවාස 10,000 සඳහා ව්‍යාපෘති කාල සීමාව අවුරුදු 06 ක් වන අතර එය 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය.

**1.7.2 අ) ව්‍යාපෘතියේ නමඃ**
**තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය**

හැටන් හී තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමත් පවතින ගොඩනැගිලි නවීකරණය කිරීමත් වෙළඳපල ඉල්ලුමට සරිලන පරිදි නව පුහුණු පාඨමාලා ඇති කිරීමත් ඊට අවශ්‍ය නව තාක්ෂණික උපකරණ ලබාදීමත් අරමුණු කොටගෙන ඉන්දීය රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මුල්‍යාධාර සපයනු ලබයි.

ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017.05.02 දින ලැබී අතර අවබෝධතා ගිවිසුම 2017.09.20 දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ ඇති කරගන්නා ලදී.

**1.7.2.ආ) දායක නියෝජිතායතනයඃ ඉන්දීය රජය**

**1.7.2 ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම. (රු. මි.) ඃ - 219.75**
ඉන්දියානු ආධාර රු.මි. 199
රජයේ දායකත්වය රු.මි. 20.75 (බදු ඇතුළු අනිකුත් අවශ්‍යතා වෙනුවෙන්)

**1.7.2 ඇ) ව්‍යාපෘති කාල සීමාවඃ අවුරුදු 03**
2017 සැප්තැම්බර් සිට 2020 සැප්තැම්බර් දක්වා අවුරුදු තුනක කාල සීමාවක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලබා දී ඇත.

# 02. පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

#### 2.1.1 විශේෂ ජයග්‍රහණ

- **වැවිලි ප්‍රජාව සඳහා වන නව ගම්මාන සංකල්පය ක්‍රියාවට නැංවීම උදෙසා "නව ගම්මාන අධිකාරිය " ආරම්භ කිරීම.**

  මෙරට විදේශ විනිමය ඉපැයීම උදෙසා වැවිලි භෝග ආර්ථිකයේ පෙර ගමන් කරුවන් ලෙස කටයුතු කරනු ලබන වතු ප්‍රජාවගෙන් 65% කට අධික ප්‍රමාණයක් තවමත් අවම මූලික පහසුකම් සහිත බැරැක්ක සම්ප්‍රදායට සකස් කරන ලද ලයින් නිවාස වාසස්ථාන කොට ගනිමින් ජීවත් වන අතර එවැනි ජීවන රටාවක් යටතේ ඔවුන් අත් විඳිනු ලබන කායික, මානසික හා සාමාජයීය දුෂ්කරතාවන් සැලකිල්ලට ගෙන, නව ගම්මාන සංකල්පය හරහා වැවිලි ප්‍රජාව වෙත අවැසි නිවාස මෙන්ම අනෙකුත් යටිතල පහසුකම් සළසාදෙමින් අන් ජන කොටස් හා සමාන ආත්ම ගරුත්වයක් සහ සමාජ තත්ත්වයක් හිමි පුද්ගලයින් බවට පත් කිරීම අරමුණු කොට, මෙම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පිහිටුවන ලද නව ගම්මාන අධිකාරියේ වැඩකටයුතු ආරම්භ කිරීමට 2019 වර්ෂයේදී මෙම අමාත්‍යාංශයට හැකියාව ලැබුනි.

  ඒ අනුව, 2019 පෙබරවාරි මස 07 දින, ප්‍රධාන විධායක නිලධරයා වන අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු හා 07 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩලයකින් යුක්තව "නව ගම්මාන අධිකාරිය" වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

- **තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මධ්‍යම පළාතේ හොඳම පුහුණු සැපයුම්කරු සඳහා වන පළාත් සම්මානයෙන් දෙවන ස්ථානය ලබා ගැනීම**

  2019 ජූලි 17 වන දින BMICH හි පැවති ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය පුහුණු විශිෂ්ටතා සම්මාන උළෙලේ මධ්‍යම පළාතේ හොඳම පුහුණු සැපයුම්කරු සඳහා වන පළාත් සම්මානයෙන් දෙවන ස්ථානය හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලදී.

#### 2.1.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

වැවිලි ප්‍රදේශයන්හි පවතින නිවාස ගැටලුව විසඳීමේත් එම ප්‍රදේශයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේත් අභියෝගයන් ජයගැනීම සඳහා අමාත්‍යාංශය විසින් පසුගිය කාලසීමාව තුළදී වැඩි අවධානයක් යොමුකරන ලදී.

##### 2.1.2.1 වැවිලි ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්තිය

වැවිලි ප්‍රදේශයන්හි මාර්ග, විදුලිය, ජල පහසුකම් වැනි වඩාත් යහපත් ජීවන මට්ටමක් ඇති කිරීමට ඉවහල් වන යටිතල පහසුකම් සීමා සහිත වේ. වැවිලි අංශයෙන් ජාතික දළ දේශීය නිශ්පාදනයට සපයන දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවතුනත් මෙම ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අඩු අවධානයක් යොමුකර ඇත. වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය වන අතර රජය විසින් "සෞභාග්‍ය දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා ද එම අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරයි.

**මාර්ග** -

වැවිලි ප්‍රදේශ වල විශේෂයෙන්ම පාසල් ළමයින්ගේ සහ රෝගීන්ගේ ගමන් පහසුව සඳහා වතු මාර්ග සංවර්ධනය කිරීම අවශ්‍යය වේ. මෙම මාර්ග වලින් බොහොමයක් ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග වන අතර එම ආයතන වලට මූල්‍ය සම්පත් හිඟවීම නිසා මාර්ග නඩත්තුව නොසළකා ඇත. එම නිසා ජනතාව ප්‍රධාන මාර්ග වලට සම්බන්ධ කරන මෙම පෝෂක මාර්ග අමාත්‍යාංශය විසින් වැඩිදියුණු කරනු ලබන අතර විශේෂයෙන් වතු රෝහල් මාර්ග සංවර්ධනයට වැඩි අවධානයක් යොමු කර ඇත.

**විදුලිබලය -**

වැවිලි අංශයේ ගෘහස්ත විදුලි පරිභෝජනය ජාතික මට්ටම හා සංසන්දනය කළ විට ඉතා අඩු ප්‍රතිශතයක පවතී. ඉදිරි වර්ෂ කිහිපය තුළ එම තත්ත්වය ප්‍රශස්ත මට්ටමකට පත්කිරීම සඳහා විදුලිබල මණ්ඩලයේ සහාය ඇතිව ඉදිකරනු ලබන නව නිවාස වෙනුවෙන් අවශ්‍ය විදුලි බල පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් -**

පානීය ජලය සැපයීම හා සනීපාරක්ෂාව ප්‍රමුකත්වය ලබා දියයුතු ක්ෂේත්‍රයන් වන්නේය. බොහොමයක් වැවිලි කලාප කඳුකර ප්‍රදේශ බැවින් බොහෝ ප්‍රදේශ වල පානීය ජලය තිබෙන නමුත් ආරක්ෂා සහිත පානීය ජලය ලැබෙන බවට සහතික විය යුතුය. එම ඉදිරි ඉලක්ක සපුරා ගැනීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය හා ප්‍රාදේශීය සභා මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා අමාත්‍යාංශය උත්සාහ දරනු ඇත.

**2.1.2.2 වැවිලි සේවකයන් සඳහා නිවාස සැපයීමේ ප්‍රතිපත්තිය**

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැලකීමේදී ද, වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාසය ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැක. වැවිලි ප්‍රජාව ජීවත් වන නිවාස වලින් 58% කට අධික ප්‍රමාණයක් පේලි නිවාස වන අතර එම නිවාස "ලැයින් කාමර" වශයෙන් හඳුන්වනු ලබයි. (ජාතික මට්ටමින් ගත් කල මෙවැනි නිවාසයන්හි ප්‍රතිශතය 3.8%කි). මීට ශතවර්ෂ දෙකකට පමණ පූර්ව කාලයකදී බ්‍රිතාන්‍ය වතු පාලකයින් විසින් වතු සේවකයින් සඳහා ඉදි කරන ලද ඉතා පැරණි මෙම පේලි නිවාස බොහොමයක් වර්තමානය වනවිට ඉතා අබලන් තත්ත්වයකට පත්ව ඇත. හිරු එළිය හා වාතාශ්‍රය අවම වීම, අධික තදබදය, පෞද්ගලිකත්වයක් නොමැති වීම, අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයකට එක් කාමරයක් තුල ජීවත් වීමට සිදුවීම මෙන්ම විවිධ වූ අපචාරයන්ට ගොදුරු වීම, අනාරක්ෂිත බව, සමාජ පිළිගැනීමක් නොමැති වීම, සෞඛ්‍යයට හා ළමුන්ගේ අධ්‍යාපනයට නුසුදුසු වටපිටාවක් පැවතීම ඇතුළු බොහෝමයක් සමාජයීය ගැටලු මෙමගින් නිර්මාණය වී ඇත. වැවිලි මානව සංවර්ධන භාරයේ 2016 වර්ෂයේ සෞඛ්‍ය වාර්තාවන්ට අනුව (Annual Helth Return - 2016) වැවිලි ක්ෂේත්‍රය තුල මෙවැනි නිවාස තුන් වර්ගයක් පමණ පවතී.

1 තනි බැරැක්ක (Single Line Houses)
2 යුගල බැරැක්ක (Double Line Houses)
3 තාවකාලික නිවාස

ඉදිරිපස ආලින්දයක් නිදන කාමරයක් හා කුඩා මුළුතැන්ගෙයකින් සමන්විත තනි බැරැක්කයක වපසරිය වර්ග අඩි 264 ක් පමණ වන අතර එක් පසකට පේළියකට පිහිටි කාමර 10 - 12 කින් සමන්විත වූ පවුල් 02 ක් ජීවත් වන යුගල බැරැක්කය වපසරිය වර්ග අඩි (ft2) 145 -175 පමණ වේ. එමෙන්ම, වැවිලි ක්ෂේත්‍රය තුල ක්‍රමිකව පවුල් සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ පවතින පේළි නිවාස ප්‍රමාණවත් නොවන විටදී, එම පේළි නිවාසවලට යාබදව ඉඩ ඇති ස්ථානවල ටකරන් තහඩු, ඉටිරෙදි ආදිය යොදා තාවකාලික නිවාස ඉදිකර ඇති අතර එම නිවෙස්ද ඉතා අඩු පහසුකම් වලින් යුක්ත වේ.

වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව අත්විඳින්නා වූ මෙකී දුෂ්කරතා මගහරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමිකර දීමේ අභිලාශයෙන්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව ආරම්භ කරන ලද නව ජීවන නිවාස ව්‍යාපෘතිය මගින් පර්චස් 07 ක ඉඩම් අයිතියද සමඟ පානීය ජල පහසුකම්, විදුලිය සහ පිවිසුම් මාර්ග ආදී යටිතල පහසුකම් වලින් යුක්තව තනි නිවසක අයිතිය ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

## 2.2 ඉදිරි ඉලක්ක

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් අංශ කිහිපයක් ඔස්සේ රජයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව එළි දක්වා ඇති අතර ඒ අනුව ඊට අනුකූල වෙමින් මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යභාරයට අනුගත වෙමින් ක්‍රියාවට නැංවිය හැකි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නව අමාත්‍යාංශයේ අරමුණ වේ. ඒ අනුව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා විශේෂයෙන් ආමන්ත්‍රණය කර ඇති වැවිලි ප්‍රජාවගේ අඩු ආදායම් තත්ත්වය සෞඛ්‍ය හා පෝෂණ ගැටලු, වාසස්ථාන හා ඉඩම් ගැටලු පිළිබඳව වැඩි අවධානය යොමු කරමින් ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කරමින් කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර එහි දී ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් දක්වා ඇති පරිදි වතු අංශයේ ළමා මන්ද පෝෂණය අවම කිරීම සඳහා විශේෂ පෝෂණ අතිරේකයක් ලබාදීමේ වැඩපිළිවෙළ ඉදිරිවසර තුලදී විධිමත්ව ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරනු ලැබේ.

එමෙන්ම වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය අමතර ආදායම් උත්පාදනයත්, විරැකියාව අවම කිරීමත් අරමුණු කරගනිමින් "සෞභාග්‍යා" වැඩසටහන හා සමගාමීව ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, කෘෂි භෝග භාවිතා සඳහා නොකරන ඉඩම් යොදා ගනිමින් ආදර්ශ ව්‍යාපෘතියක්, කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීටමත් ඒ හරහා කාබනික කෘෂි භෝග නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට වගාව දිරිමත් කිරීම, ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමත් ඉදිරියේදී අපේක්ෂා කරනු ලැබේ.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාම ශක්ති හා ප්‍රජා ශක්ති ව්‍යාපෘතීන් වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන්ගේ හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් හා අධීක්ෂණයෙන් මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමටත් එමගින් වැවිලි ප්‍රජාව සඳහා අමතර ආදායම් උත්පාදන මාර්ග සලසාදීමත් අමාත්‍යාංශයේ ඉදිරි ඉලක්කය වී ඇත.

# 03. පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

තත්‍ය

| අයවැය 2019 | | සටහන | 2019 | 2018 |
|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - |
| - | ආදායම් බදු | 1 | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - |
| | **ආදායම් නොවන ලැබීම්** | | - | - |
| 3,797,022,000 | භාණ්ඩාගාර අග්‍රිම | | 1,479,160,000 | 1,839,817,825 |
| - | තැන්පතු | | 103,105,787 | 127,663,842 |
| 7,000,000 | අත්තිකාරම් ගිණුම් | | 10,505,962 | 13,984,814 |
| - | වෙනත් ලැබීම් | | 40,956,377 | 25,840,748 |
| **3,804,022,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,633,728,126** | **2,007,307,229** |
| **3,804,022,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,633,728,126** | **2,007,307,229** |
| | **අඩුකළා : වියදම්** | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - |
| 148,450,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 146,307,741 | 122,518,890 |
| 103,100,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 100,221,285 | 91,711,663 |
| 121,750,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 121,311,998 | 102,066,782 |
| - | පොළී ගෙවීම් | 8 | - | - |
| 50,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 45,297 | - |
| **373,350,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **367,886,321** | **316,297,335** |
| | **මූලධන වියදම්** | | | |
| 7,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 6,402,983 | 9,681,122 |
| 6,050,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 4,169,193 | 6,761,702 |
| 4,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 3,000,000 | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - |
| 2,300,000 | හැකියා වර්ධනය | 14 | 1,186,119 | 980,978 |
| 4,274,359,000 | වෙනත් මූලධන වියදම් | 15 | 2,641,942,707 | 2,241,100,922 |
| **4,294,509,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **2,656,701,001** | **2,258,524,724** |
| **16,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **114,630,241** | **65,514,502** |
| - | **තැන්පතු ගෙවීම්** | | 102,435,494 | 45,882,237 |
| 16,000,000 | **අත්තිකාරම් ගෙවීම්** | | 12,194,747 | 19,632,265 |
| **4,683,859,000** | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 3,139,217,563 | 2,640,336,561 |
| **(879,837,000)** | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(1,505,489,438)** | **(633,029,332)** |

## 3.3 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - සී**

| | | තත්‍ය | |
|---|---|---|---|
| අයවැය 2019 | සටහන | 2019 | 2018 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 239,578,744 | 235,409,551 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 35,223,474 | 33,534,689 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **274,802,218** | **268,944,240** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (163,419,209) | (164,384,646) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 239,578,744 | 235,409,551 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 198,642,683 | 197,919,335 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **274,802,218** | **268,944,240** |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| ..................................................... | ..................................................... | ..................................................... |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : | දිනය : | දිනය : |

## 3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය** **ඒසීජ් - සී**

| | තත්‍ය | |
|---|---|---|
| | **2019** | **2018** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 40,956,377 | 25,840,748 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 103,105,787 | 127,663,842 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 1,479,160,000 | 1,800,206,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,623,222,164** | **1,953,710,590** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,385,582,018 | 1,789,772,585 |
| සහනාධාර සහ මාරුකිරීම් | 122,311,998 | 102,066,782 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 6,334,870 | - |
| තැන්පතු ගෙවීම් | 102,435,494 | 45,882,237 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 337 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,616,664,380** | **1,937,721,941** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **6,557,783** | **15,988,649** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 9,806,157 | 10,196,434 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | 9,806,157 | 10,196,434 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 4,169,193 | 6,761,702 |
| අත්තිකාරම් ගෙවීම් | 12,194,747 | 19,433,381 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 16,363,940 | 26,195,083 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | (6,557,783) | (15,998,649) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | 0.00 | (10,000) |

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උෟ)** | - | - |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෟ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | 0.00 | (10,000) |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | 0.00 | (10,000) |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

### 3.5.1 වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

### 3.5.2 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### 3.5.3 ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

### 3.5.4 දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

### 3.5.5 දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

### 3.5.6 මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| | | | | | රු. ,000 |
|---|---|---|---|---|---|
| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | අදාල නැත | - | - | - | - |

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| | | | | රු. ,000 |
|---|---|---|---|---|
| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 368,000 | 373,350 | 367,886 | 99% |
| ප්‍රාග්ධන | 3,515,000 | 4,294,509 | 2,656,701 | 62% |

## 3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| | | | | | | රු.,000 |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය | i) අංක CAX-5630 දරණ කාර් රථයේ කල්බදු වාරික ගෙවීම සඳහා | 5,444 | 5,444 | 5,444 | 100% |
| | | ii) උපාධිධාරි අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 500 | 500 | 363 | 73% |

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| | | | | | රු. ,000 |
|---|---|---|---|---|---|
| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | කොවිඩ් වසංගතය හේතුවෙන් 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කර අවසන් කිරිමට නොහැකි වී ඇත. | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 239,578,744 | - | 100% |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එෆ්/එල්එස්/සී/එම්එච්අයිසී/එෆ්ඒ/02/2019
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020 මැයි 27 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **11(1)** වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **11(1)** වගන්තිය ප්‍රකාරව ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(6)** ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **10** වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **2019** දෙසැම්බර් **03** දිනැති අංක **271/2019** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් **2019** දෙසැම්බර් **31** දිනට ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

2

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.1 (ආ) | **2018** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් | එම වරද **2019** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි කර සන්සන්දනාත්මක අගය නිවැරදි කර දැක්විය යුතුය. |

3

| | | |
|---|---|---|
| | නොවන ලැබීම් යටතේ රු.**1,800,206,000** ක් වෙනුවට වෙනත් මූලාශ්‍ර වලින් ලද රු.**39,611,825** ක් ද ඇතුළත්ව රු.**1,839,817,825** ක් දක්වා තිබුණි. | |
| **1.6.7 (අ)** | නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන ණය මුදල් සඳහා සියයට හතරක පොළියක් අයකරන බව දක්වා ඇති නමුත් එම ආදායම අයකර ගැනීම සම්බන්ධ තොරතුරු හෝ වර්ෂය තුල ලැබූ ණය පොලී ආදායම හෝ ලැබිය යුතු ණය පොලී ආදායම හඳුනාගත හැකි පරිදි පොත් පත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව පොත් පත් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය |
| **1.6.7 (ආ)** | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| **1.6.7 (ඇ)** | බැරකම් පිළිබඳ ලේඛනය මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළ යුතු වීම. |
| **1.6.7 (ඈ)** | මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) අනුව මහජනයාට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා මුල් ගෙවීම සඳහා අධිකාර බලය දීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා පොත්පත් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව පොත් පත් පවත්වා ණය මුදල් අයකර ගැනීමට යුතුව කටයුතු කළ යුතුය. |
| 1.6.8 (අ) | ගොඩනැගිලි කුලී, සේවා සැපයීම් හා ඉදිකිරීම් ව්‍යාපෘතිවල බැඳීම් පරීක්ෂා කිරීම සඳහා එකඟ වී ඇති ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මුදල් රෙගුලාසි 702(3) අනුව කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්වලට එළඹිය යුතු බව. |
| 1.6.10 **(ii)** | මුදල් රෙගුලාසි 570 සහ 571(1), (3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉකුත්වූ තැන්පතු අවස්ථා 35 ක එකතු වටිනාකම රු.9,008,068 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 570 සහ 571(1), (3) රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

4

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවිය යුතු අග්‍රිම ශේෂය රු.1,505,489,438 බැර ශේෂයක් වන නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන තැන්පතු ලැබීම් හා පොදු ලෙජර් වියදම් වන තැන්පතු ගෙවීම් ශේෂ වැරදියට සටහන් කිරීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව නිවැරදි අග්‍රිම ශේෂය රු.1,505,436,382 ක් වෙනුවට රු.53,055ක් වැඩියෙන් රු. 1,505,489,438ක් ලෙස බැර ශේෂය දක්වා තිබුණි. ඒ අනුව අග්‍රිම ගැලපීම් ගිණුම ද වැරදියට දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) තැන්පතු ලැබීම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේදි තැන්පතු ලැබීම් ලෙස භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ශේෂය වන රු.**103,192,966** ක් වෙනුවට දෙපාර්තමේන්තු තැන්පතු ගිණුමේ ලැබීම් ශේෂය රු.**103,105,787**ක් ලෙස සටහන් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ තැන්පතු ශේෂය රු.**87,180** ක් අඩුවෙන් දක්වා තිබීමෙන් මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ශේෂය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) තැන්පතු ගෙවීම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේදි තැන්පතු ගෙවීම් වලට අදාලව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ශේෂය වන රු.102,469,619 ශේෂය වෙනුවට දෙපාර්තමේන්තු තැන්පතු ගිණුමේ රු102,435,494 ක් ලෙස සටහන් කර තිබුණි. එම නිසා මුල්‍ය ප්‍රකාශනයේ ප්‍රධාන ලෙජර් වියදම්හි තැන්පතු ගෙවීම් ශේෂය රු.34,125 ක් අඩුවෙන් දක්වා තිබීම නිසා මුළු වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 අක් මුදල් ගැලැපුම් ගිණුම

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

ඉහත පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම බැර ශේෂය රු.53,055 කින් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු වටිනාකම සෙවීමට සකස් කරන ලද අග්‍රිම ගැලපීම් ගිණුමද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව එම ගිණුමට දෙපාර්තමේන්තු පොත්

5

අනුව සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව පොදු තැන්පතු ගිණුමේ ලැබීම් හා ගෙවීම් ශේෂයන්ගේ වෙනස වන පිළිවෙලින් රු.87,180 ක් හා රු.34,125ක් ගැලපීම් කල විට ගෙවිය යුතු අග්‍රිම ශේෂය රු.1,505,436,382 වේ. එම ශේෂය භාණ්ඩාගාර පොත් අනුව ගැලපිය යුතු ශේෂයක් බව අමාත්‍යාංශය විසින් පිළිතුරු ලබා දී තිබුණි.

1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

-----------------------------------

මූල්‍ය නොවන වත්කම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2018 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට රු.240,865,352 ක දේපළ, පිරියත හා උපකරණ ශේෂය දැක්විය යුතු වුවත්, එය රු.5,455,801 ක් අඩුවෙන් රු.235,409,551 ක් ලෙස දක්වා තිබූ අතර එය නිවැරදි කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය සඳහා එම ශේෂය ආරම්භක ශේෂය ලෙස ගැනීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ ශේෂය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6.4** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

-----------------------

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් වන පොදු තැන්පතු ලැබීම් රු.103,105,787 ක් ද පොදු තැන්පතු ගෙවීම් රු.102,435,494 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වැරදියට වර්ග කර තිබුණි. එම නිසා එම ලැබීම් හා ගෙවීම් වල වෙනස වන රු.670,293 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩියෙන් ද, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අඩුවෙන් ද දක්වා තිබුණි

6

**1.6.5** මුල්‍ය ප්‍රකාශණය ඉදිරිපත් කිරීම

1.6.5.1 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය (ඒසීඒ 2 (ii) )

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) වැය විෂය අංක 140-1-2-1203 අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනය වන රු. 50,000 න් වර්ෂයේ වියදම් කිරීමෙන් පසු ඉතිරිය රු.14,000 වී තිබුණි. එම ඉතිරිය සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 28 ක් වුවද එම ප්‍රතිශතය 2019 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය වන ඒසීඒ 2 (ii) හි දක්වා නොතිබූ බැවින් ඉතිරියට අදාල හේතු දැක්වීම් ද ගිණුම් ප්‍රකාශනයේ සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2019 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනයේහි වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය වන ඒසීඒ 2 (ii) යටතේ මු.රෙ 66 මාරුකිරීම් වලට අදාලව දැක්විය යුතු රු.1,400,000 ක් වූ වටිනාකම, වැරදියට පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ වර්ග කර දක්වා තිබීම හේතුවෙන් මුල්‍ය ප්‍රකාශයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මු.රෙ 66 මාරු කිරීම් යටතේ වටිනාකම අඩුවෙන් ද දක්වා තිබුණි.

1.6.5.2 2019 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම - (ඒසීඒ 4 )

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට අංක 6000-0-0-13-0088-0 හා අංක 6000-0-0-16-0082-0 තැන්පතු ගිණුම් 2 ක් අමාත්‍යාංශය සතු වූ අතර භාණ්ඩාගාරය අනුව දැක්විය යුතු ශේෂය පිළිවෙලින් රු.5,580,898 හා රු.193,061,785 ක් වුවද එම ශේෂයන් වෙනුවට අමාත්‍යාංශයේ පොත් අනුව ශේෂය වන රු.5,615,023 ක් හා රු. 192,974,605 ක් වැරදියට දක්වා තිබුණි.

1.6.5.3 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම - (ඒසීඒ 5 )

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ
ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් ආකෘති අංක ඒසීඒ 5 හි, අත්තිකාරම් ගිණුම් අංක 8493/0/0/0140/0012 හි ශේෂ පිරික්සුම අනුව දෙපාර්තමේන්තුවේ පොත් අගය වන රු.1,387,917 ක් වෙනුවට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂය වන රු.2,087,722 ක් දක්වා තිබුණි. ඒ අනුව එම අත්තිකාරම් ගිණුමෙහි පොත් අගයේ බැර ශේෂය රු.699,805 කින් වැඩියෙන් දක්වා තිබුණි.

7

1.6.5.4. පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය - සටහන් අංක (11)

.......................................................................................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) **2018** දෙසැම්බර් 31 දිනට පැවති භාණ්ඩ සමීක්ෂණය 2019 මැයි 13 දින සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ නමුත්, එය මුදල් රෙගුලාසි 757 (2) (අ) හා (ආ) අනුව ඒවායේ අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ ඊ සහ ඒ අකෘතියේ සටහන් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. නෙස්කැෆේ මැෂිමක්, ශීතකරණයක් , වායු සමීකරණ යන්ත්‍ර , විදුලි පංකා , අල්මාරි ආදී භාණ්ඩ ඇතුලත් භාණ්ඩ වර්ග 41 ක් යටතේ අයිතම 236 ක ඌණතාවයක් ඉහත සමීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය වූ නමුත් එම නැතිවූ භාණ්ඩ සම්බන්ධයෙන් හානි හා පාඩු ලේඛණයට ඇතුලත් කර මුදල් රෙගුලාසි 103(1) අනුව කටයුතු කර හානි පාඩු හඳුනා ගෙන පොත්වලින් කපාහැරීමට හා 2019 මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක (11) යටතේ ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) තවද මෙම ප්‍රකාශයේ වාර්තා කර ඇති **CAJ 4341** හා **JY 2971** යන වාහන අනතුරු 2 ක පිළිබඳව මු.රෙ.109 ප්‍රකාරව පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතිය ලේකම් විසින් පිළිවෙලින් 2019 දෙසැම්බර් 06 දින හා 07 වන දින වලදී ලබා දී තිබූ නමුත් පොත් වලින් කපාහැරීම සඳහා 2020 මැයි 28 වැනිදා තෙක්ම කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද සිදු වූ අලාභයේ තක්සේරු වටිනාකමින් අයකර ගත් වටිනාකම් වන පිළිවෙලින් රු.597,719 ක් හා රු.202,455 ක් ද, පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය ද මෙම ප්‍රකාශයට ඇතුල් කිරීමෙන් තොරව ඉදිරිපත් කර තිබුණි.

1.6.5.5 බැරකම් හා බැඳීම්වලට එළඹීම හා ගෙවීම

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක (iii) ප්‍රකාරව බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැඳීම්, බැඳීම් ශේෂය , බැරකම් හා බැරකම් ශේෂය යන සියළුම තීරු වල සමාන අගයන් දක්වා තිබූ අතර එම අගයන් සනාථ කරගැනීම සඳහා විගණනයට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් නොවිය.

(ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 2017/255 ට අනුව සියලු බැරකම් බැරකම් ලෙස ලේඛන ගත කළ යුතු වුවත් එසේ ලේඛණ ගත නොකරන ලද, නමුත් 2020 පෙබරවාරි 29 දින වන විට ගෙවීම් කර තිබූ සැපයීම් හා සේවා සම්බන්ධයෙන් නොවන වැය විෂයන් 3 ක් හා **සැපයීම් හා සේවා සම්බන්ධයෙන්** වන වැය විෂයන් 3ක් යටතේ මුළු බැරකම් වටිනාකම පිළිවෙලින් රු.613,417 ක් හා රු.1,086,080 ක් මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක **(iii)** යටතේ සටහන් කර නොතිබුණි.

8

**1.6.6** විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ බැදීම් පරීක්ෂා කිරීම සඳහා මුදල් රෙගුලාසි **702(3)** අනුව ගොඩනැගිලි කුලී, සේවා සැපයීම් හා ඉදිකිරීම් සම්බන්ධව පිළියෙල කල කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් මේ දක්වා විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) නිවාසලාභීන්ට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් ඔවුන් විසින් කෙරෙන කොටස් ගෙවීම් අනුව **2019** දෙසැම්බර් **31** දින වන විට අයකර ඇති ණය මුදල, පොලිය හා වැවිලි සංවර්ධන භාරය විසින් එකතු කර ඇති නමුත් අමාත්‍යාංශයට නැවත ගෙවා නොමැති මුදල් වෙනුවෙන් හිලවු කරගත් කළමනාකරණ ගාස්තු ප්‍රමාණය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් හා එම මුදල් ආපසු අයකර ගැනීමට අදාල සියලුම ගණුදෙනු සටහන් කර තබාගත් පොත්පත් හා ලේඛණ විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු වලට අදලව කාල විශ්ලේෂණයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වන ප්‍රාග්ධන වැය විෂයයන් **3** ක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා **2019** වර්ෂය තුල රු. **2,800,000,000** ක ප්‍රතිපාදන වෙන්කර ඇති නමුත් ඇතිකරගත් බැදීම් සම්බන්ධයෙන් ගිවිසුම් හා **2019** දෙසැම්බර් **31** දිනට එම බැදීම් වලින් කොපමණ ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත්ද හා එදිනට පවතින බැරකම් ප්‍රමාණය හදුනාගත හැකි .පරිදි කොන්ත්‍රාත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණ අතර විස්තරාත්මක උපලේඛණයක් හෝ විගණනයට ඉදිරිපත් නොවිය. ඊට අමතරව **2019** දෙසැම්බර් **31** දක්වා වූ ඉදිකිරීම් පිළිබද මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තාව ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ දක්වා ඇති බැරකම් හා බැදීම් වටිනාකම් වල නිවැරදි බව තහවුරු කල නොහැකි විය..

(ඉ) මුදල් අමාත්‍යාංශය විසින් 2017 පෙබරවාරි නිකුත් කර ඇති ව්‍යාපෘති කළමණාකරණය සහ කොන්ත්‍රාත් කළමණාකරණය සඳහා මගපෙන්වීමෙහි මුදල් සපයන නියෝජිත ආයතනය මගින් පවත්වාගෙන යා යුතු ලේඛන හා ආකෘති සම්බන්ධව කාණ්ඩ අංක 2හි සඳහන් පරිදි ගෙවීම් ලේඛණ හා වාර්තා (ආකෘති අංක CA 32,CA33,CA34,CA 51, 53) අමාත්‍යාංශය පවත්වාගෙන ගොස් නොතිබුණි.

9

**1.6.7** ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 හා 447 (4) හා (5) | බැරකමට අදාල ඇණවුම් ආදී ලියවිලි පිළිබද යොමුවක්ද ඇතුළුව එක් එක් මාසය අවසානයේ ඉතිරි බැරකම් හා විලම්භනය කරන ලද බැරකම්ද හඳුනාගත හැකි ආකාරයට බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි |
| චක්‍රීය අරමුදල සඳහා පොත්පත් පවත්වා ගැනීම | මුදල් රෙගුලාසි 501 (ඈ) හා 502 (ආ) | මහජනයාට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා මුල් ගෙවීම සඳහා අධිකාර බලය දීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා පොත්පත් පවත්වා නොතිබුණි. |

10

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 අග්‍රිම කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය රු.4,667,859,000 ක් වන අතර අමාත්‍යාංශයේ අග්‍රිම සැලැස්ම අනුව වර්ෂය තුළ ඉල්ලුම් කළ යුතු මුළු අග්‍රිමය රු.3,797,022,000 ක් විය. එම අග්‍රිම සැලැස්ම ද ඉක්මවා එකතුව රු.3,903,315,000 ක අග්‍රිම වර්ෂය තුළ ඉල්ලුම කර තිබුණි. 2019 වර්ෂයේ එක් එක් මාසයක දී ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් අමාත්‍යාංශය සඳහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය අවමය සියයට 16 සිට උපරිම සියයට 98 දක්වා විය. මේ අනුව රු.1,479,160,000 ක් වූ මුළු අග්‍රිම ලැබීම්, මුළු අග්‍රිම ඉල්ලීම් එකතුවෙන් සියයට 38 ක් පමණක් විය. එය වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් පමණි.

2.2 ආදායම් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ණය පොලී අය කරගැනීම

.......................................

අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇති මහ පෙන්වීම අනුව නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන ණය මුදල් සඳහා සියයට හතරක පොළියක් අයකරන බව දක්වා ඇති නමුත් එම ආදායම අයකර ගැනීම සම්බන්ධ තොරතුරු හෝ වර්ෂය තුල ලැබූ ණය පොලී ආදායම හෝ ලැබිය යුතු ණය පොලී ආදායම හඳුනාගත හැකි පරිදි පොත් පත් පවත්වා නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ගිණුම් අංශය මගින් ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශයෙහි වෙනත් ලැබීම් (200399) යටතේ නිවාස ණය නැවත අයකර ගැනීම් රු. 33,980,202 ක් දක්වා ඇති අතර ආදායම් ආපසු අයකරගැනීම් ලෙස රු.27,969 ක් වශයෙන් මුලු එකතුව රු.33,952,233 ක් රජයේ ආදායමට බැර කර තිබුණි. නමුත් 2020 මැයි 28 දිනැති හා MHNV/3/3(III) general audit 54 අංක දරන සංවර්ධන අංශයේ අතිරේක ලේකම්ගේ ලිපියට අනුව 2019 වර්ෂයේ මුළු ණය නැවත අය කිරීම රු.14,284,419 ක් බවට දක්වා තිබීම නිසා 2019 වර්ෂයේ ණය නැවත අය කිරීම හා රජයේ ආදායමට බැර කල ශේෂය අතර රු.19,695,783 ක වෙනසක් නිරීක්ෂණය විය.

11

2.3 වියදම් කළමනාකරණය

---------------------------

2.3.1 පුනරාවර්තන වියදම

..........................

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශ ලේකම් අමතන ලද ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/EE140/1/4 හා 2019 ජුලි 17 දිනැති ලිපිය මගින් වැය විෂය අංක 140-02-04-05-2506 (13 ) සහ (17) යටතේ වාර්ෂික ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු. මිලියන 120.25 හා රු. මිලියන 15 ක් අවුරා තබන ලෙස දැනුම් දී තිබිය දී එයට පටහැනිව වැය විෂය අංක 140-02-04-05-2506 (13 ) සඳහා වෙන්කළ සියළුම ප්‍රතිපාදන ද, වැය විෂය අංක 140-02-04-05-2506 (17 ) සඳහා රු. මිලියන 4.9 ක් පමණක් ද ඉතිරි කර තිබු බව නිරික්ෂණය විය.

2.3.2 මුලධන වියදම්

....................

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලධන වැය විෂයන් 11 ක් සඳහා වෙන්කළ රු.2,811,550,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,179,103,828 ක් වැය කර සියයට 25 සිට 99 දක්වා වු පරාසයක් තුළ රු.1,632,446,173 ක ඉතිරියක් නිරික්ෂණය විය. මේ අනුව අදාළ අරමුණු හා කාර්යයන් සඳහා නිසි පරිදි මුදල් යොදා නොමැති බවත් හෝ අධි ප්‍රතිපාදනයක් සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) **140-2-4-2-2506** හා **140-2-4-3-2506** යන මුලධන වැය විෂයන් 2 ක් සඳහා එකතුව රු.200,000,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන 2019 ජුලි 01 දින සම්මත කර තිබුණි. නමුත් වර්ෂ අවසානයේ එසේ සම්මත කර ගත් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයද ඉක්මවා රු. **1,559,991,875** ක් වන ලෙස ඉතිරිවීම් සිදු කර තිබුණි. ඉතිරි වීම් සඳහා ඉදිරිපත් කල හේතු ලෙස ඉල්ලුම් කල පරිදි අක්මුදල් නොලැබීම බව දක්වා තිබුණි.

(ඇ) **140-1-2-1-2201** යන මුලධන වැය විෂය සඳහා රු.3,000,000 ක් හා රු.1**,500,000** ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන **2019** පෙබරවාරි 14 හා **2019** සැප්තැම්බර් 20 දින සම්මත කර තිබුණි. ඉන් සියයට 33.3 ක් පමණක් එනම් රු.**1,500,000** ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරි වීමට හේතු ලෙස ඉල්ලුම් කල පරිදි අක්මුදල් නොලැබීම බව දක්වා තිබුණි.

12

2.3.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුම

..........................................................................

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ඇමුණුම් 2 හි දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂයේ ලැබීම් වලට අදාලව 8493/0/0/0140/0011 යටතේ රු.8,423,432 ක් ද 8493/0/0/0140/0012 යටතේ රු.2,087,722 ක් ද දක්වා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කල අමාත්‍යාංශයේ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව ලැබීම් ශේෂයන් පිළිවෙලින් රු.8,418,240 හා 1,387,917 වේ. ඒ අනුව අමාත්‍යාංශ පොත් අනුව ලැබීම් ශේෂයන් හා ශේෂ පිරික්සුමෙහි 11 යටතේ රු.5192ක් හා 12 යටතේ රු.699,805 ක වෙනසක් විය. මෙම ශේෂයන්ගේ වෙනස් වීම අනාවරණය කර ගැනීම සඳහා අත්තිකාරම් පාලන ගිණුම නිවැරදිව සකස් කර නොතිබීම හේතුවී ඇති බව නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර සටහන් හා "බී "ගිණුම ඉදිරිපත් කිරීමේදී මුදල් රෙගුලාසි 427(4) අනුව වෙනස්කම් වලට හේතුන් වෙන් වෙන්ව හඳුනාගැනීමෙන් තොරව රු.400 ක ශුද්ධ වෙනස පමණක් ගිණුමේ 2.1 ආකෘතියේ දක්වා තිබුණි.

(ආ) 2018 මැයි 15 දින අමාත්‍යාංශයෙන් වෙනත් අමාත්‍යාංශයකට ස්ථානමාරු වී ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය රු.91,754 ක් ද, 2018 ජූනි 07 දින පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය රු.247,000 ක් ද ලෙස සටහන් කර ගෙන තිබුණි. එම හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 118 හා 2004 ඔක්තෝබර් 11 දිනැති චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 ඡේද ප්‍රකාරව 2020 මැයි 13 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 ජූලි 22 දින මිය ගිය නිලධාරියෙකු ගෙන් අයවිය යුතු රු.136,550 ක හිඟ ආපදා හා උත්සව අත්තිකාරම් ණය මුදල් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4, 4.5 හා 4.6 පරිදි කටයුතු කර අයකරගෙන නොතිබුණි.

(ඉ) 2018 ජූනි 15 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.134.000 ක හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.3 හා 4.2.4 හා 4.2.5 සහ 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ද අනුව කටයුතු නොකිරීම හේතුවෙන් එම ණය ශේෂ 2020 මැයි 26 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දින වන විට සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.326,582 ක් විය. එම ශේෂයන් තුළ 2014 ඔක්තෝබර් 30 දින සේවය අතහැර ගිය එනම් වසර 5 ක් ඉක්මවූ නිලධාරියෙකු ගෙන් අයවිය යුතු රු. 107,896 ක් හා 2013 නොවැම්බර් 05 දින සේවයේ අතහැර ගිය එනම් වසර 6 ක් ඉක්මවූ නිලධාරියෙකු ගෙන් අයවිය යුතු රු. 2,250 ක ණය

ශේෂ සම්බන්ධයෙන් විගණන දින වන 2020 මැයි 26 දින දක්වාම ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

(ඌ) 2017 ජූලි 25 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයට අනුව **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුමේ සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී එහි ඇමුණුම් 3. 2 සිට 3.7 දක්වා ඉදිරිපත් කරණ ලද ඇමුණුම් වල නිලධාරියා ගේ තනතුර හා කාල විශ්ලේෂණය ඇතුලත් කර නොතිබුණි.**

2.4 බැරකම් හා බැදීම්වලට ගෙවීම් කිරීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 අප්‍රේල් 27 දිනැති 255/2017 අංක දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව 2018 වර්ෂයේ කාර්යයන් සඳහා 2019 වර්ෂයේදී ගෙවීම් කිරීමට 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ බැදීම් ලෙස දක්වා තිබිය යුතු නමුත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව බැරකම් හා බැදීම් කිසිවක් දක්වා නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව හා 2019 ඔක්තෝබර් 31 දක්වා වූ ප්‍රගති වාර්තාව අනුව 2018 වර්ෂයේ ආරම්භක එම වර්ෂයේ නිම නොකර ඉදිරියට ගෙන එන ලද නිවාස ඒකක 1,566 ක් අතරින් නිවාස 1489 ක් සඳහා රු.මිලියන.280.578ක් ඉහත චක්‍රෙල්ඛයට පටහැනිව 2019 වර්ෂයේදී ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

-----------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

14

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 214 | මුදල් තිබෙන බවටත් නිතිපතා බිල් ලැබෙන බවටත් සහතික විම පිණිස බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල යුතු වුවද විගණනයට ඉදිරිපත් කරන ලද බැරකම් ලේඛනය එලෙස පරීක්ෂා කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. |
| (ආ) මුදල් රෙගුලාසි අංක 501 (ඇ) හා 502 (ආ) | නිවාසලාභීන්ට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගැනීමට අවශ්‍ය තොරතුරු සහ සියලුම ගණුදෙනු සටහන් කර තබා ගැනීමට ප්‍රමාණවත් පොත්පත් විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) මු.රේ 570 සහ මු.රෙ.571(1) | මු.රෙ.571 ප්‍රකාරව ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව මු.රෙ 570 ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ලැයිස්තුවක් පිළියෙල කල යුතු වුවත් එසේ පිළියෙළ කර නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි **571** (3) | අංක 6000-0-0-13-0088-0 හා අංක 6000-0-0-16-0082-0 දරන තැන්පතු ගිණුම් දෙකේ තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉකුත් වූ තැන්පතු අවස්ථා පිළිවෙලින් 10 ක හා 106 ක එකතු වටිනාකම පිළිවෙලින් රු.526,834.46 ක හා රු.55,829,126.84 ක ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

15

(ඉ) මුදල් රෙගුලාසි අංක 702 (3) — අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියළුම කොන්ත්‍රාත්තු පිටපත් තුනකින් අත්සන් කර ඉන් එක් පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

.2.7 අවිධිමත් ගනුදෙනු

-------------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව අධිකාර බලය නොමැති ගනුදෙනු

-----------------------------------------------------------------------

ඇපයෙන් සීමිත සමාගමක් වන වැව්ලි මානව සංවර්ධන භාරය වර්ෂ ගණනාවක සිට අමාත්‍යාංශය වෙනුවෙන් ණය එකතු කර ඇත. එහි විගණිත මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට ගෙවිය යුතුව පැවති ශේෂය රු.මිලියන 31.02 ක් විය. 2020 මැයි 28 දිනැති හා **MHNV/3/3(III) general audit** 54 අංක දරන සංවර්ධන අංශයේ අතිරේක ලේකම්ගේ ලිපියට අනුව වැව්ලි මානව සංවර්ධන භාරයට ගෙවිය යුතුව පැවති කළමණාකරණ ගාස්තුවලින් රු.මිලියන 2.97ක් සමාලෝචිත වර්ෂයේදී ලැබීම් ලෙස අයකරගත් බව දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී එකතු කල මුදල් හැර 2018 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන් පමණක් තව දුරටත් වැව්ලි මානව සංවර්ධන භාරයෙන් අමාත්‍යාංශයට ලැබිය යුතු හා රජයේ ආදායමට බැර විය යුතු වටිනාකම රු.මිලියන 28.05ක් බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු ගනුදෙනු

-----------------------------------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන නිවාස යෝජනා ක්‍රමවල කොන්ත්‍රාත් අධීක්ෂණයට අමතරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම වැව්ලි මානව සංවර්ධන භාරය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1(අ) මාර්ගෝපදේශයෙන් බැහැරව ඉටුකර ඇති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් නමින් ගෙවිය යුතු චෙක්පත් පළමුව වැව්ලි මානව සංවර්ධන භාරය නමින් නිකුත් කිරීමට ලබාගත් අනුමැතිය ද විගණනයට ඉදිරිපත් නොවිය.

16

**3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එච්.එන්. රණතුංග
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

17

# 04. පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| මූලික පහසුකම් සහිත ලබාදුන් නව නිවාස සංඛ්‍යාව | | | 30 % |
| වහල සෙවිලි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව | | | 13 % |
| ලබා දුන් ජල සම්පාදනය ව්‍යාපෘති සංඛ්‍යාව | | | 60% |
| සම්පූර්ණ කරන ලද නව වැසිකිළි සංඛ්‍යාව | | | 16 % |
| සංවර්ධනය කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | | | 40 % |
| අලුත් වැඩියා කරන ලද/ සංවර්ධනය කරන ලද වතු මාර්ග සංඛ්‍යාව | | 84 % | |
| ලබාදුන් පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | | | 58 % |
| පවත්වන ලද ප්‍රජා පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | | 36 % |
| වෘත්තීය පුහුණුව ලබා දුන් සංඛ්‍යාව | | | 26 % |

අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 2,724 ක අක්මුදල් ප්‍රමාණයක් (මුල්‍යකරණ අංක 11 හා 17 මගින්) ඉල්ලුම් කලද 2019.12.31 දින වන විට ලැබූ අක්මුදල් ප්‍රමාණය වූයේ රු.මි. 1,268 කි.

අමාත්‍යාංශය විසින් සිදුකරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්හි අපේක්ෂිත නිමැවුමට ලඟාවීම සඳහා ඉල්ලුම් කරන ලද අක්මුදල් ප්‍රමාණය නොලැබීමද බලපෑ ඇත.

# 05. පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-<br>49% | 50%<br>74% | 75%<br>100% |
| තිරසර සංවර්ධන ඉලක්කය 11<br>**2030 වනවිට සියළු දෙනාටම ප්‍රමාණවත්, ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තහවුරු කිරීම** | ලයින් කාමරවල වෙසෙන පවුල් 4,500 ක් සඳහා නව නිවාස හා ඉඩම් හිමිකම ලබාදීම අබලන් වූ ලයින් කාමර 1000 ක වහල නැවත සෙවිළි කිරීම | 1<br><br><br><br><br>2 | ඉදි කරන ලද නව නිවාස සංඛ්‍යාව හා ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු ප්‍රමාණය<br><br>සෙවිළි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව | 30%<br><br><br><br>13% | | |
| **තිරසර සංවර්ධන ඉලක්ක 6**<br><br>වසර 2030 වනවිට සියළු දෙනාටම ප්‍රසස්ථ මට්ටම් යටතේ පානීය ජලය ලබාගැනීමට සමාන අවස්ථා තහවුරු කිරීම.<br><br>වසර 2030 වනවිට ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් හා ස්වස්ථතාවක් ලැබීමේ අවස්ථා සියළු දෙනාටම අත්පත්කර ගැනීම | පානීය ජල පහසුකම් නොමැති පවුල් 4000 ක් සඳහා ජල පහසුකම් සම්පාදනය<br><br>ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් 3500 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම | 1<br><br><br><br>1 | පානීය ජල පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව<br><br><br>සනීපාරක්ෂක පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව/ | 48%<br><br><br><br>40% | | |
| **තිරසර සංවර්ධන ඉලක්ක 04**<br><br>වසර 2030 වන විට සියළු ගැහැණු හා පිරිමි ළමයින් සඳහා ගුණාත්මක මට්ටමේ පූර්ව ළමා විය සංවර්ධනයක් සඳහා ප්‍රවේශය ලැබීම | පෙර පාසල් ළමුන් 400ක් ආවරණය වන පරිදි වතු ළමා සංවර්ධන මධ්‍යස්ථාන 15 ක් සංවර්ධනය | 1<br><br><br>2 | සංවර්ධනය කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව<br>ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව | 46% | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **තිරසර සංවර්ධන ඉලක්ක 01 හා 02 දුගී බව අවසන් කිරීම**<br>**ආහාර සුරක්ෂිතතාව**<br><br>ඉලක්ක 01<br><br>2030 වනවිට අන්ත දරිද්‍රතාව තුරන් කිරීම හා<br><br>ඉලක්ක 02<br><br>2030 වනවිට සාගින්න තුරන්කිරීම හා දරිද්‍රතාවෙන් පෙළෙන්නන් සඳහා පෝෂණීය හා ප්‍රමාණවත් ආහාර අඛණ්ඩව ලබා ගැනීම සහතික කිරීම | ජීවනෝපාය සංවර්ධනය හා ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ වැඩසටහන් 1,000 ක් ක්‍රියාත්මක කිරීම | 1<br><br>2 | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | | | 83% |

## 5.2 සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

**තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝගඃ**

ශ්‍රී ලංකාවේ වාසය කරන මිලියන එකක් පමණ වන වැව්ලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

වැව්ලි ප්‍රජාව යනු, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී, වඩාත් පහළ ජීවන තත්ත්වයකට උරුමකම් කියනු ලබන ජන කොට්ඨාසයක් වන අතර ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත වලට අනුව ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී ඔවුන් උපයන මාසික ආදායම පහල මට්ටමක පවතින අතර ප්‍රජාවගේ විශේෂයෙන් වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. 2012 ජන සංගණන වාර්තා අනුව සෞඛ්‍ය ආරක්ෂිත පානීය ජල පහසුකම් ඇත්තේ වතු ජනගහණයෙන් 52% පමණ ප්‍රමාණයකට වන අතර ජනගහණයෙන් 65% ඉතා අවම පහසුකම් සහිත වර්ග අඩි 200 ට පමණ සීමාවූ ටකරන් සෙවිලිකල ලැයින් කාමර සිය වාසස්ථාන කොට ජීවත් වේ. තිරසර ලෙස සංවර්ධිත වූ ශ්‍රී ලංකාවක් සඳහා වන තිරසර සංවර්ධන අරමුණු අතරට ගැනෙන දිළිඳුකම අවම කිරීම තහවුරු කිරීම ළමා මන්ද පෝෂණ තත්ත්ව දර්ශක වලට ලඟාවීම සහ ආරක්ෂිත හා වැඩිදියුණු කල වාසස්ථාන හිමිකර දීම, සැමට ප්‍රශස්ථ මට්ටමේ පානීය ජලය ලබා ගැනීමේ අවස්ථා හිමිකර දීම යන ඉලක්ක සාක්ෂාත් කිරීම සඳහා ක්‍රියා කිරීමේදී, එම පහසුකම් අවම මට්ටමේ පවතින වැව්ලි ප්‍රජාව කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව තිබේ.

ඒ අනුව වැව්ලි ප්‍රජාව සඳහා සිය ආරක්ෂිත වාසස්ථාන හිමිකර ගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ඔවුන් වෙත සින්නක්කර අයිතිය හිමිවූ පරචස් 7 ක භූමි භාගයක් හා පානීය ජල පහසුකම් සමඟ වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් වලින් යුක්ත තනි නිවහන් ලබා දීමට හැකි වීම මෙම අමාත්‍යාංශය ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

එසේ නමුත්, විවිධ පාරසරික හේතු හා තාක්ෂණික හේතූන් මත අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම අභියෝගයක් වී ඇත. මෙතැන තිබූ කොටස ඉවත් කර මෙම කොටස යොදන ලදී.

නිවාස ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීමත්, නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් සපයා ගැනීම අසීරු වීමත්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත්, විශේෂයෙන් නිවාස ඉදි කිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයේ පවතින දුර්වලතාත් හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් වී ඇත.

වැව්ලි ප්‍රජාවගෙන් හරි අඩකට පමණ ආරක්ෂිත පානීය ජල පහසුකම් නොමැති වීමත්, ශ්‍රී ලංකාව විසින් තිරසර

සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ කාර්යභාරයේදී වැවිලි ප්‍රජාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ නොකොට එම ඉලක්ක වෙත ලඟාවීම අභියෝගයක්ව ඇති අවස්ථාවක, වැවිලි ප්‍රජාව ඉලක්ක කොට ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ඒ සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන වෙන් නොවීමත් විශේෂයෙන්ම ආරක්ෂිත පානීය ජලය සපයා ගැනීම සඳහා සුදුසු ජල මූලාශ්‍ර නොමැති වීමත්, පවතින ජල මූලාශ්‍ර පාදක කර ගනිමින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් වැයවීමත් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක සඳහා ප්‍රමාණවත් පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට අදාල පාර්ශවයන් කටයුතු නොකිරීමත් හේතුවන් අපේක්ෂිත ඉලක්ක සුපරා ගැනීම ගැටළුක් වී ඇත.

වැවිලි ප්‍රදේශ බොහොමයක් කඳුකරයට සීමාවී ඇති අතර එහි භූ විෂමතාව සැලකිල්ලට ගැනීමේදී ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීමත්, එම ප්‍රදේශ බොහොමයක් අධි ආරක්ෂිත සංවේදී කලාප වශයෙන් හඳුන්වා දීමත් හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය අනුමැතීන් කල් ගත වීමත් එසේ නොමැති අත්‍යවශ්‍ය ස්ථාන සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පාරිසරික හේතු නිසා අනුමත නොකිරීමද ගැටළුවක් වී ඇත.

# 06. පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 21 | 13 | 8 |
| තෘතීයික | 6 | 3 | 3 |
| ද්විතියික | 279 | 254 | 25 |
| ප්‍රාථමික | 36 | 33 | 3 |
| එකතුව | 342 | 303 | 39 |

### 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය බලපාන ආකාරය

මිලියනයකට අධික වැව්ලි ප්‍රජාවගේ සුබ සාධනය වෙනුවෙන් පිහිටුවා ඇති මෙම අමාත්‍යාංශයට පැවරී ඇති පුළුල් වගකීම් හා රාජකාරි ඉටුකිරීමෙහිලා අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ප්‍රධාන ගැටලුවකි. දැනට අනුමත කාර්ය මණ්ඩලයේද පුරප්පාඩු පැවතීම නිසා මෙම තත්වය තවදුරටත් උග්‍ර වී ඇති අතර දෛනික රාජකාරි ඉටුකිරීමේදී ද ඉමහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත. අමාත්‍යාංශය තුළ ජ්‍යෙෂ්ඨ තනතුරු 08 ක්ද, තෘතීයික තනතුරු 3 ක්දණි ද්විතීයික තනතුරු 25 ක්ද, ප්‍රාථමික තනතුරු 03 ක්ද පුරප්පාඩුව පවතියි. ජ්‍යෙෂ්ඨ තනතුරු පුරප්පාඩුවීම තීරණ ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීමට බලපෑම් කරන අතර, සංවිධාන ධූරාවලිය නිසිලෙස ක්‍රියාත්මක නොවීමටද බලපෑම් එල්ල විය හැකිය. එවිට තෘතීයික, ද්විතීයික, හා ප්‍රාථමික සේවකයන්ගේ සඵලදායකත්වයට බලපෑම් එල්ල වෙයි. ද්විතීයික මට්ටමේ සේවක ඌනතාවය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමෙහිලා ඍජුව බලපායි. අමාත්‍යාංශය විසින් සිදු කරන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රශස්ත මට්ටමේ ලගාකරගැනීමට බාධා එල්ලවීමේ සිට සමස්ත කාර්යසාධනයට මානව සම්පත් ඌනතාවය බලපෑම් එල්ල කරයි.

ඒ අනුව ද්විතීය මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු 09 ක් හා සංවර්ධන නිලධාරි සේවයේ පුරප්පාඩු 03 ක් පැවතීමද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවයේ අනුමත තනතුරු 02 කම පුරප්පාඩු වී පැවතීමද දෛනික රාජකාරි ඉටුකිරීමේදී ද ඉමහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත. තවද තාක්ෂණ නිලධාරි සේවයේ අනුමත සේවක සංඛ්‍යාව අටක් (08) වන අතර දැනට කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් තිදෙනෙකු (03) සේවයේ නිරත වන අතර තාක්ෂණ නිලධාරි සේවයේ පුරප්පාඩු 05ක් පවතී. මෙම අමාත්‍යාංශයේ ඉන්දියානු රජයේ මධ්‍ය පරිමාණ ප්‍රදාන වැඩසටහන යටතේ වැවිලි ප්‍රජාවට නිවාස 14,000 ක් ඉදි කිරීම සඳහා වූ නිවාස ව්‍යාපෘතිය යනාදී ව්‍යාපෘති ගණනාවක්ද ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශයට පැවරී ඇති පුළුල් වගකීම හා රාජකාරි ඉටුකිරීමෙහිලා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ප්‍රධාන ගැටලුවක්ව පවතී.

තවද කළමනාකරණ සේවයේ (II/I) ශ්‍රේණිවල අත්දැකීම් බහුල නිලධාරීන් නොමැති වීමත් ආයතන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට බාධාවක් ද පවතී. පරිපාලන නිලධාරි තනතුරද පුරප්පාඩුව පවතින අතර දැනට සේවය කරනු ලබන්නේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරියෙකි. අධ්‍යක්ෂ සැළසුම් තනතුර ද පුරප්පාඩුව පවතින අතර අධ්‍යක්ෂ ඉංජිනේරු හා සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු අනුමත තනතුරු දෙකෙන් දැනට එක් නිලධාරියෙකු පමණක් සේවයේ නිරත වේ. මෙම අමාත්‍යාංශය මගින් වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වන බැවින් මෙම තනතුරු පුරප්පාඩුව පැවතීම දෛනික රාජකාරි කිරීමේදී මෙන්ම ව්‍යාපෘතිවල සංවර්ධන ඉලක්ක ප්‍රසස්ත මට්ටමින් ලගා කර ගැනීමට මෙන්ම සමස්ථ කාර්යසාධනයටද මානව සම්පත් ඌනතාවය බලපෑමක් වී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු. 000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඵලදායී අධීක්ෂණය සඳහා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා පරිපාලනය සඳහා අවශ්‍යතා | 02 | දින 01 | 7 | | දේශීය | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්තු වලට එළඹීමේ දී හා ඒවා නියමිත පරිදි අධීක්ෂණය නොවීම හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක ප්‍රතිපාදන හා එම ගැටලු මගහරවා ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණය හා පරිපාලනය සිදු කරන ආකාරය |
| නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 05 | දින 01 | 35 | | දේශීය | නගර/නව ජනාවාස ඉදි කිරීමේදී එම ව්‍යාපෘති සැළසුම් කරනු ලබන අවස්ථාවේදී පටන් ඉදි කිරීම් අතරතුර හා ජනාවාස පිහිට වූ පසුත් එකතු වන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේද සැළසුම් කිරීම |
| ප්‍රායෝගික නොවන පිරිවිතර මත කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීම හා ගැටලු | 02 | දින 01 | 7 | | දේශීය | ප්‍රායෝගික නොවන පිරිවිතර මත කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීම මත ඇතිවන දූෂණ, ආරාවුල් හා ගැටළු හා ඒවා මග හරවා ගන්නා ආකාර්ය |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු පිළිබඳ ඩිප්ලෝමාව | 01 | අවුරුදු 01 | 100 | | දේශීය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවළිය විධිමත්ව අනුගමනය කිරීම හා ඒ අනුව ගිවිසුම් වලට එළඹීම |
| ප්‍රමාණ බිල්පත් මිලකරණය සහ අනුපාත විශ්ලේෂණ | 02 | දින 05 | 30 | | දේශීය | ඉදිකිරීම් සම්බන්ධ බිල්පත් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කිරීමේදී අදාල මිලකරණය හා සකසා ඇති නිරවරද්‍යතාව පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| භාෂිත දෙමළ පාඨමාලාව | 01 | දින 10 | 27 | | දේශීය | දෙමළ භාෂාව හැසිරවීම |
| ලිපිගොනු කළමණාකරණය, සාමාන්‍ය කාර්ය පරිපාලනය හා ආයතන සංග්‍රහය | 02 | දින 03 | 7 | | දේශීය | කාර්යාලීය ක්‍රම පහසු වන ආකාරයට ලිපිගොනු පවත්වා ගැනීම හා එහි ඇති වැදගත්කම හා ඊට අදාල ආයතනික සංග්‍රහ රෙගුලාසි |
| පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | මාස 06 | 25 | | දේශීය | කාර්යාල අවශ්‍යතා වෙනුවෙන් පරිගණක මෘදුකාංග භාවිතය (Ms WORD / Ms Excel) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාබනික ගෙවතු වගාව පිළිබඳ දෙදින වැඩසටහන | 80 | දින 04 | 97 | | දේශීය | ගෙවතු නිර්මාණය, ගෙවතු වගාව, කාබනික පොහොර සැකසීම, දේශීය පළිබෝධ නාශක ක්‍රම හඳුනා ගැනීම.<br>වැවිලි ප්‍රජාව සඳහා සුදුසු ගෙවතු වගා ක්‍රම හඳුනාගැනිම හා ඔවුන් ඒ සඳහා පෙළඹවීමට ඇවැසි ප්‍රායෝගික දැනුම භාවිතය |
| වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 200 | දින 04 | 162 | | දේශීය | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන නිලධාරීන් සෘජුව සම්බන්ධවන වතු ආශ්‍රිත බිම් මට්ටමේ ප්‍රජාව හා වතු කළමාණාකාරීත්වය සමඟ කටයුතු කිරීම සඳහා මෘදු කුසලතා, සන්නිවේදන කුසලතා හඳුනාගැනීම ලිපිගොණු කළමණාකරණය, ව්‍යාපෘති යෝජනා හා වාර්තා සකස් කිරීම ව්‍යාපෘති පරීක්ෂාව හ වාර්තාකරණ පිළබඳ මූලික දැනුම ලබා ගැනීම |
| ධාරිතා පුහුණු සංවර්ධන වැඩසහටන | 100 | දින 01 | | | දේශීය | කාර්යාල ලිපිකරණය, ලිපි ගොණුකරණය, තැපෑල හා කාර්යාල කළමණාකරනය ආයතන කටයුතු, පිළිබඳ දැනුම. විනය හා හැසිරීම පිළිබඳ අවබෝධය හා රාජකාරී වගකීම හා යුතුකම් හඳුනා ගැනීම<br>අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම් භාවිතය හඳුනාගැනිම<br>මූල්‍ය කළමණාකරණය සහ හානි හා පාඩු ලේඛන නඩත්තුව පිලිබඳ දැනුම |
| මානව සම්පත් කලමනාකරණයේ හා පරිපාලනයේ යහ පුරුදු | 01 | දින 10 | 690 | 248 | විදේශීය | රටක සමස්ථ සංවර්ධනය ඉලක්ක කරමින් මානව සම්පත් හැසිරවීම සඳහා මානව සම්පත් සැළසුම් කිරීමේ දීර්ඝ කාලීන වැදගත්කම හා ඒ අනුව, මානව සම්පත සැළසුම් කිරීම, උපයෝගී කිරීම හා පුහුණු කිරීම පිළිබඳ ව මැලේසියානු රජය විසින් අනුගමනය කරනු ලබන සාර්ථක ක්‍රියා මාර්ග සහ අන්තර් ජාතික අත් දැකීම් |
| මානව සම්පත් කළමනාකරණය | 01 | දින 10 | 896 | | විදේශීය | ආයතිනක කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වා ගැනීම සඳහා මානව සම්පත් කලමනාකරණය කිරීම හා ඒ පිළිබඳව චීන රජය ගනු ලැබූ ක්‍රමවේද පිළිබඳ අන්තර් ජාතික අත් දැකීම් |
| සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | 01 | දින 11 | 388 | 274 | විදේශීය | විවිධ ව්‍යාපෘතින් අදාලව සැපයුම් ජාලය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අවධානය යොමු කල යුතු අවස්ථා, එම අවස්ථා සැළසුම් කිරීම, මගහැරීමෙන් ඇතිවන ගැටලු හා සැපයුම් දාම කලමනාකරණයේ වැදගත්කම හා ඊට සහසම්බන්ධිත විදේශිය අත් දැකීම් |
| ආසියා පැසිෆික් රටවල් සඳහා කඩදාසි රහිත වානිජ්‍ය හා විද්‍යුත් වාණිජ්‍යය පිළිබඳ 2019 සම්මන්ත්‍රණය | 01 | දින 13 | 28 | 61 | විදේශීය | පිරිවැය සහ කාල කළමණාකරණයේ ඵලදායීතාවය සියලු අංශ සඳහා වඩාත් වැදගත් වේ. පරිගණක හා අන්තර්ජාල සම්බන්ධතා හරහා ලිපි ලේඛන යොමු කිරීමෙන් මුද්‍රිත මාධ්‍යයෙන් සිදුකරනු ලබන වැඩ අඩු කිරීමට රාජ්‍ය අංශය දරන උත්සාහයට දායකවීමට හැකිවීම. කාර්යමණ්ඩලය අතර සන්නිවේදනය පහසුවීම. |

### 6.3.1 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායකවන ආකාරය

ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් සංවර්ධනය සෘජුව බලපෑම් කරන ආකාරය අමාත්‍යාංශය තුළින් මනාව දක්නට ලැබේ. 2019 වසරේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් තුළින් ආයතනයේ කාර්යසාධනය වර්ධනය වු ආකාරය 2019 වසරේදී දක්නට ලැබුණි. දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වු නිලධාරීන්ගේ කැපීපෙනෙන කාර්යසාධනය ක් පසුගිය වසර තුලදීත් පෙන්නුම් කරන ලදී.

කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පාඨමාලා, පරිපාලන කුසලතා, සිංහල හා දෙමළ භාෂා පිළිබඳ පුහුණු පාඨමාලා, ව්‍යාපෘති කළමනාකරණය, සැළසුම්කරණය හා පරිගණක පුහුණු වැඩසටහන් ආදී විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ගණනාවක් සඳහා ආයතනයේ සැලකියයුතු සේවක සංඛ්‍යාවක් සහභාගී කරවා ඇත. මෙම පුහුණු වැඩසටහන් වලින් පසු අදාළ සේවකයින් නිවැරදි කාර්යාල කළමනාකරණ ක්‍රම භාවිත කිරීමට, ආයතනය තුළින් පැන නගින ගැටලු විසඳාගැනීමට නිවැරදි ප්‍රසම්පාදන තීරණ ගනිමින් රාජ්‍ය මුදල් නිවැරදිව පරිහරණය කිරීමටද, සුදුසුම සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමට සමත් වීම සහ උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති සැළසුම්කරණයේදී හා යාවත්කාලීන කිරීමේදී මනා සම්පත් දායකත්වයක් සැපයීමෙන්ද ආයතනයේ කාර්යසාධනය ඉහල නැංවීමට දායක වී ඇත.

# 07. පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල නොවේ | සියළුම ආකෘති ඉතා නිවැරදිව සකස් කිරීමේදී දිනක කාලයක් පසු වීම | වර්ෂය මුල සිටම අවශ්‍ය තොරතුරු රැස් කරමින් සූදානම් වීම |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | මෙම අමාත්‍යාංශය රාජ්‍ය ව්‍යාපාර පවත්වාගෙන යනු නොලබයි | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | එම | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | එම | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අදාළ කාලසීමාව තුල පිළිතුරු ලබාදී නොමැත. | නියමිත දිනට පිළිතුරු ලබාදෙන ලෙස දන්වා ඇත. |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ඇතැම් අභන්තර විගණන විමසුම් සඳහා මාසයක් තුල පිළිතුරු ලබා දී නොමැත. | ඒ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ (ගොඩනැගිලි හා වාහන) | අවසන් ගිණුම්වල හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මෙම තොරතුරු ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් නියමිත කාලයේදී ඉටු කිරීම |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | පවතින වසංගත (Covid 19) තත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණයට අදාල කටයුතු නිසිපරිදි අවසන් කරගැනීමට නොහැකි වීම | චක්‍රලේඛ උපදෙස් නියමිත කාලයේදී ඉටු කිරීම |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | එම | චක්‍රලේඛ උපදෙස් නියමිත කාලයේදී ඉටු කිරීම |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | එම | චක්‍රලේඛ උපදෙස් නියමිත කාලයේදී ඉටු කිරීම |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල නොවේ | අදාළ වර්ෂයේ ප්‍රතිපාදන තුලින් පසුගිය වර්ෂයන්ට අදාළ ව්‍යාපෘතීන්ටද ගෙවීම් කිරිමට සිදුවීම හේතුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් සඳහා යොමු වුවද අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවීම් සිදුකර නොමැත. | පවත්නා වර්ෂයට අදාළ ව්‍යාපෘතීන් එම වර්ෂය තුලදීම සම්පූර්ණ කිරීම තුලින් එම වර්ෂය තුලම ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම |
| 12 | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | මිය යාම හෝ සේවය අතහැර යාම | එවැනි සේවකයන්ගේ කටයුතු කාර්යක්ෂම කිරීම |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | මෙම අමාත්‍යාංශය ආදායම් උපයන ආයතනයක් නොවේ. | අදාල නොවේ |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | එම | අදාල නොවේ |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | එම | අදාල නොවේ |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | පැවැති වෙබ් අඩවිය දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොමැති අතර එය නව මුහුණුවරකින්ද නොමැත. අමාත්‍යාංශය සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කරමින් පවතින අතර එය අවසන් අදියරට ලඟා වෙමින් පවතී. | මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් ඇති පරිදි අමාත්‍යාංශයේ තොරතුරු ඇතුලත් කොට වෙබ් අඩවිය සකස්කොට අවසන් කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |